**<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>**

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

**<u>පැමිණිලිකරු.</u>**

| | |
|---|---|
| **නඩු අංකය** | **: 3155/විශේෂ** |
| **ස්වභාවය** | **: විශේෂ** |
| **වටිනාකම** | **: රු.100,000/-** |
| **කාර්ය පටිපාටිය** | **: සාමාන්‍ය** |

**එදිරිව**

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලික් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>වින්තිකරුවෝ.</u>

1990 ක්වූ සැප්තැම්බර් මස 13 වැනි දිනදී ය.

ද සිල්වා සහ පෙරේරා යන නාමය, අභිධානය සහ විලාසය යටතේ නීති වෘත්තියේ නිරත ජේ.ඩබ්ලිව්.ඩී.පෙරේරා සහ ඔහුගේ සාහයක වර්ණන් ගුණරත්න මඟින් පෙනි සිටින ඉහත නම සඳහන් **<u>පැමිණිලිකරුගේ පැමිණිලි පත</u>** පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.

1. (අ) පැමිණිලිකරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනයේ සම්මාන සාමාජිකයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයෙහි සම්මාන සාමාජිකයෙකු වන අතර, කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ 1982 අංක.17 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සීමාසහිත වගකීම් සහිත සමාගමක් වන කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ වෙයි.

(ආ) පැමිණිලිකරු ව්‍යාපාරික සහ කළමණාකාර උපදේශකවරයෙකු වශයෙන් නිරතව සිටින අතර, ඔහුට කීර්තිමත් සේවාදායක පිරිසක් සිටිති. තවද, ඔහු ශ්‍රී ලංකාවේ ලෝක බැංකුවෙන් මුදල් යොදන විශාලතම ව්‍යාපෘතියක මූලික උපදේශකවරයාත් වෙයි.

(ඇ) පැමිණිලිකරු එක කොටසක් රු.10/- වන සාමාන්‍ය කොටස් 70,000 අයිතිව සිටිමින්, ''ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ්'' සමාගමේ සාංගමික සංස්ථාපත්‍රයට හා ව්‍යවස්ථාවට දායකයෙකු සහ එකී සමාගමේ අධ්‍යක්ෂකවරයෙක් වෙයි. මෙම සමාගම 1983.10.20 දින සිය නම 4 වැනි විත්තිකාර සමාගමේ ''හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්' යන නමට වෙනස් කරන ලදි. එකී ''ලංකා ජැපෑන්

හොටෙල්ස් ලිමිටඩ්'' සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය හා ව්‍යවස්ථාවේ, එහි 1983.03.15 දිනැති සංස්ථාපන පත්‍රයේ, එකී සමාගමේ පළමු අධ්‍යක්ෂකවරුන් පිළිබඳව දැනුම් දෙන අංක.48 දරණ ආකෘති පත්‍රයේ හා හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් යන නමට වෙනස් කිරීම දැනුම් දුන් අංක.43 දරණ ආකෘති පත්‍රයේ සහ නම හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් යන නමට වෙනස් කිරීමට බලය දෙමින් නිකුත් කළ 1983.10.20 දිනැති සහතිකයේ සත්‍ය පිටපත් පිළිවෙළින් **පී1, පී2, පී3, පී4ඒ සහ පී4බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටී.

2. (අ) ඉහත නම් සඳහන් 1 වැනි විත්තිකාර සමාගම ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ජාපනයේ ඉහත සඳහන් කළ ලිපිනයෙහි පිහිටා තිබෙන සහ මෙම අධිකරණයේ බලසීමා ප්‍රදේශය ඇතුළත ඉහත සඳහන් කළ ලිපිනයේ සම්බන්ධීකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන සමාගමක් වෙයි. මෙහි පහත සමහරවිට ''මිට්සුයි'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ආ) 1 වැනි විත්තිකාර සමාගම වෙළඳ කටයුතු, කර්මාන්ත, වාණිජ කටයුතු සහ ඉදිකිරීම් කටයුතු ඇතුළු ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින බහුජාතික සමූහ ව්‍යාපාරයක සාමාජික සමාගමක් වෙයි.

(ඇ) 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම ඉහත නම සඳහන් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ කොටස් හිමියෙකු වන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි. තවද, 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීම සඳහා සහ එයට වුවමනා උපකරණ සැපයීම සඳහා 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ එක කොන්ත්‍රාත්කරුවකු, සැපයුම්කරුවකු සහ එක මුදල් ණයට සපයන්නකු වූයේ ය. 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් මහජනයාට කොටස් නිකුත් කිරීමක් සඳහා නිකුත් කරන ලද 1984.03.06 දිනැති ප්‍රකාශ පත්‍රයේ නම්කර ඇති අනුග්‍රාහකයෙකුත් වූයේ ය. එකී ප්‍රකාශ පත්‍රයේ සත්‍ය පිටපතක් **පී5** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

3. (අ) ඉහත නම සඳහන් 2 වැනි විත්තිකාර සමාගම ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන පවත්නා, එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ජාපනයේ ඉහත සඳහන් කළ ලිපිනයෙහි පිහිටා තිබෙන සහ ශ්‍රී ලංකාවේ ඉහත සඳහන් කළ ලිපිනයේ සම්බන්ධීකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන සමාගමක් වෙයි. මෙහි පහත සමහරවිට 'තායිසෙ' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ආ) 2 වැනි විත්තිකාර සමාගම ජපානයේත්, ජපානයෙන් පිටපතත් විශාල ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන සමාගමක් වෙයි.

(ඇ) 2 වැනි විත්තිකාර 'තායිසෙ' සමාගමක් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ කොටස් හිමියෙකු වන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි. තවද, 2 වැනි විත්තිකාර තායිසෙ සමාගම කොළඹ එකී හිල්ටන් හෝටලය ඉදිකිරීම සඳහා සහ එයට වුවමනා උපකරණ සැපයීම සඳහා 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ එක කොන්ත්‍රාත්කරුවකු සහ එක මුදල් ණයට සපයන්නෙකු වූයේ ය. 2 වැනි විත්තිකාර තායිසෙ සමාගමත් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් මහජනයාට කොටස් නිකුත් කිරීමක් සඳහා වන නිකුත් කරන ලද 1984.03.06 දිනැති ප්‍රකාශ පත්‍රයේ (පී5) නම්කර ඇති අනුග්‍රාහයෙකුත් වූයේ ය.

4. (අ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර එකී මිට්සුයි සහ තායිසෙ සමාගම් එක්ව හා වෙන් වෙන්ව ක්‍රියාකළ ප්‍රවර්ධකයෙකුව, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය ඇති කොටස් හිමියන් සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ කොන්ත්‍රාත්කරුවන් සහ මුදල් ණයට සපයන්නන් වූ අතර, 'මිට්සුයි/තායිසෙ' කොන්සෝර්ටියම් වශයෙන් නම්කර හඳුන්වනු ලැබීය. මෙහි සමහර විට 'මිට්සුයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය' වශයෙන් හඳුන්වනු ලැබේ.

(ආ) එකී මිට්සුයි තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයේ එක නියෝජිතයෙක් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ පරිපාලනය සහ එදිනෙදා කටයුතු කළමණාකරණය කිරීමට සහ පාලනය කිරීමට විධායක බලය ඇතිව පූර්ණකාලීනව නේවාසික අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කොළඹ සිටියේ ය.

5. (අ) ඉහත නම සඳහන් 3 වැනි විත්තිකාර සමාගම ජපානයේ නීති යටතේ ජාපනයේ නිසි ලෙස පිහිටුවා ඇති සහ එහි ප්‍රධාන කාර්යාලයය ජාපනයේ ඉහත සඳහන් කර ඇති ලිපිනයෙහි තිබෙන සංස්ථා සමාගමක් වෙයි. මෙහි පහත සමහරවිට ''ගෘහ නිර්මාණ ශිල්පීන්'' වශයෙන් හඳුන්වනු ලැබේ.

(ආ) 3 වැනි විත්තිකාර සමාගම, වෙනත් ව්‍යාපාර අතර, වෘත්තීය ගෘහ නිර්මාණ ශිල්පය සහ සැලසුම්කරණය පිළිබඳව ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(ඇ) 3 වැනි විත්තිකාර සමාගම මෙහි පහත සඳහන් කරනු ලබන ඉදිකිරීමේ ගිවිසුමේ සඳහන් කළ ගෘහ නිර්මාණ ශිල්පීන් වූ අතර, තවද, එකී ගිවිසුමට දායකයෙක් විය.

6. (අ) ඉහත නම සඳහන් 4 වැනි විත්තිකාර සමාගම 1982 අංක.17 දරණ සමාගම් පනත යටතේ නිසි ලෙස සංස්ථාගත කළ සීමාසහිත වගකීමක් සහිත සමාගමක් සහ එහි ලියාපදිංචි කළ කාර්යාලයය සහ මෙහෙයුම් කාර්යාලයය මෙම අධිකරණයේ බලසීමා ප්‍රදේශය ඇතුළත කොළඹ ඉහත සඳහන් කල ලිපිනයෙහි පිහිටා තිබේ. මෙහි සමහරවිට ''හොටෙල් ඩෙවලොපර්ස් සමාගම'' වශයෙන් හඳුන්වනු ලැබේ.

(ආ) 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම කලින් ''ලංකා ජපෑන් හොටෙල් ලිමිටඩ්'' වශයෙන් හැඳින්වූ අතර, 1983.10.20 දින එම නම එහි වර්තමාන නම වන ''හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්'' යන නමට මාරු කරන ලදී.

(ඇ) තවද, 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම කොළඹ ඇව්ලන් චතුරශ්‍රයෙහි පිහිටා තිබෙන කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකාර සමාගම වෙයි.

(ඈ) පැමිණිලිකරුට අතිරේකව 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂවරු පහත සඳහන් අය වෙයි.

කොර්නල් ලයනල් පෙරේරා (සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂක)
ෆ්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්
කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි
දොන් පීටර් සෙවරිනස් පෙරේරා
කඳුටාකා කොබෝයි
කණපතිපිල්ලේ ෂන්මුගලිංගම්
කොජි ඉතෝ

ඔවුහු පිළිවෙලින් ඉහත නම සඳහන් 5, 6, 7, 8, 9, 10 සහ 11 වැනි විත්තිකරුවෝ වන අතර, මෙම නඩුව පිළිබඳව දැනුම්දීම සඳහා පාර්ශවකරුවන් වශයෙන් එකතු කර ඇත.

මෙම නඩුවට වැදගත් සියලු කාලයන්හිදී ම ඒ. නකා (1984.03.06 සිට 1986.11.24 දක්වා) එච්.ඔගාමි (1986.11.24 සිට 1990.04.30 දක්වා) එයවලුන් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ විධායක අධ්‍යක්ෂකවරු වූවෝ ය. ඔව්හු 1 වැනි සහ 2 වැනි විත්තිකාර 'මිට්සුයි තායිසෙ කොන්සෝර්ටියම්

සංවිධානයේ' නියෝජිතයෝ වූහ. 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ වර්තමාන අධ්‍යක්ෂකවරුන්ගේ නම් සහිත 1990 මැයි මස 03 දිනැති අංක. 48 දරණ සමාගම් ආකෘති පත්‍රයේ සහතික පිටපතක් **පී4සී** ලෙස ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

7. මෙහි පහත දක්වා ඇති නඩු නිමිත්ත මෙම අධිකරණයෙහි බලසීමා ප්‍රදේශය ඇතුළත කොළඹ දී පැනනැගුණි.

8. (අ) එකී ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් සමාගම, ජාත්‍යන්තරව හඳුනා හොටෙල් කළමණාකාර සමාගමක් වන නිව්යෝර්ක් නුවර හිල්ටන් ඉන්ටර්නැෂනල් විසින් කළමණාකරණය කරනු ලැබීමට ශ්‍රී ලංකාවේ කොළඹ, ඇව්ලන් චතුරශ්‍රයේ ගොඩනැගීමට තිබූ පළමුවැනි පන්තියේ හෝටලයක් දියුණු කර අනුග්‍රහය දැක්වීමේ සහ අයිතිව සිටීමේ අරමුණ ඇතිව පිහිටුවා සංස්ථාගත කරන ලදී.

(ආ) පැමිණිලිකරු එකී ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට හා ව්‍යවස්ථාවට දායකයෙකුව සිටීමට අතිරේකව, 1979 අවුරුද්දේ පටන් එකී හොටෙල් ව්‍යාපෘතියේ සංවර්ධන වැඩකටයුතුවලට ක්‍රියාකාරිව සම්බන්ධ වූ, එකී සමාගමේ පළමු අධ්‍යක්ෂකවරුන්ගෙන් එක් අයෙක් වූයේ ය.

9. (අ) 1983.03.30 දින හෝ ඊට ආසන්නයේ දී පමණ මෙහි පහත සමහරවිට ''හිල්ටන් හොටෙල්'' වශයෙන් හඳුන්වනු ලබන සහ වර්ග මීටර් 40,000 පමණ වන මුළු බිම් ප්‍රමාණයක් ඇති ඇතුළත නෙරා සැදුණු ගර්භය සහිත කාමර, එනම් ඇතුළට නෙරා සෑදුණු ගර්භය සහිත අමුත්තන්ගේ කාමර 452 සහිත ජාත්‍යන්තර තරුපහේ පංතියේ හෝටලයක් ඉදිකිරීමට සහ මෙහෙයවීමට 1 වැනි සහ 2 වැනි විත්තිකාර 'මිට්සුයි තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය සහ ඉහත කී සමාගම් පනත යටතේ සංස්ථාගත කළ සමාගමක් වන කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම විසින් සහ අතර මූලික ගිවිසුමකට අත්සන් කර ඇතුළත් වූවෝ ය. **<u>එකී මූලික ගිවිසුමේ</u>** සත්‍ය පිටපතක් **පී6** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

(ආ) යෝජිත එකී හිල්ටන් හෝටලය, පළමුව ශ්‍රී ලංකා රාජ්‍ය විසින් එකී කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගමට බදු දෙනු ලැබීමට තිබූ අක්කර 6.6 ප්‍රමාණයකට ඉතා කිට්ටු ඉඩමක් මත ගොඩනැගීමට තිබුණු අතර, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ කොටස් වෙන්කරදීම හේතුකොට ගෙන එකී කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම එකී ඉඩමේ බද්ද 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට අතුරු බදු දුන්නේ ය.

(ඇ) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම විසින් ඉදිරිපත් කරන ලද සහ ඉදිකිරීමේ ගිවිසුමට අමුණා තිබූ ගෘහ නිර්මාණ සැලැස්ම අනුව ගොඩනැගූ එකී හිල්ටන් හෝටලය ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර එකී හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පාලනය කිරීමට තිබුණි.

(ඈ) <u>ඉදිකිරීම් වැඩ සඳහා ජාපන යෙන් 11,962,000,000 මුදලක කොන්ත්‍රාත්තුවක් සඳහා එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය සහ ගෘහ භාණ්ඩ සවිකිරීමේ සහ උපකරණ සඳහා ජපාන යෙන් 1,680,000,000 මුදලක කොන්ත්‍රාත්තුවක් සඳහා 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම සමග සහ සැළසුම් සහ අධීක්ෂණ සේවා සඳහා ජාපන යෙන් 400,000,000 මුදලක කොන්ත්‍රාත්තුවක් සඳහා 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා එකී ප්‍රාථමික ගිවිසුම 1983.03.30 දින ගිවිසුම ක්‍රියාත්මක වනවිට එකඟ වී ඇත.</u>

(ඉ) එකී මූලික ගිවිසුම අත්සන් කිරීමත් සමඟ 1983 මාර්තු මස 30 දින යෝජිත හෝටලය ඉදිකිරීම සඳහා 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කරනු ලැබ ඇත. මෙම කරුණ මෙහි පහත සඳහන් කරනු ලබන පසුව 1984 ජනවාරි මස 31 දින ලියා අත්සන් කළ ඉදිරිකිරීමේ ගිවිසුමෙන් ස්ථිර කරුනු ලැබ ඇත.

10. (අ) 1981 අගෝස්තු මාසයේ දී හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පිළියෙල කරනු ලැබ පළමු මුළු වසරේ මෙහෙයුම් සඳහා වන සාමාන්‍ය කාමර අගය ඇමෙරිකානු ඩොලර් 70 සිට ඇමෙරිකානු ඩොලර් 73 දක්වා වෙනස් කරමින් ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශයේ සාමාන්‍ය කාමර අගය වෙනස් කිරීමට ඔවුන් කැමති බව 1983.03.31 දිනැති හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ ලිපියෙන් ස්ථිර කරන ලදී. (මෙම ලිපියේ පිටපතක් 1 වැනි විත්තිකාර සමාගමට යවන ලදී.) 1981 අගෝස්තු මාසයේ පිළියෙළ කරන ලද හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ පූර්වානුමාන ප්‍රකාශය කාමර හාරසිය පනස්හයක් (මෙයින් කාමර හාරසිය පනස් දෙකක් අමුත්තන් සඳහා සහ කාමර හතරක් කළමණාකරුවන්ගේ පාවිච්චිය සඳහා විය.) සම්බන්ධයෙන් වූ අතර, මෙම පදනම මත එකී ආදායම් සහ වියදම් පූර්වානුමාන ප්‍රකාශය ගණන් බලනු ලැබ ඇත. හිල්ටන් ජාත්‍යන්තර ආයතනය විසින් 1981 අගෝස්තු මස පිළියෙළ කරනු ලැබූ ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශයේ සහ එකී ආයතනයේ 1983.03.31 දිනැති ලිපියේ සත්‍ය පිටපත් පිළිවෙලින් **පී7බී සහ පී7ඒ** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

(ආ) හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පිළියෙළ කරන ලද එකී ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශය, ඇතුළට නෙරා සෑදුණු ගර්භය සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පණස් දෙකක් සහ කළමණාකරුවන්ගේ කාමර හතරක් වන ඇතුළට නෙරා සෑදුණු සහ ගර්භය සහිත කාමර හාරසිය පණස් හයක් සඳහා ඉඩකඩ සැළසූ තුන්වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම විසින් එකී හෝටල් ව්‍යාපෘති සඳහා නිමකළ ගෘහ නිර්මාණ සැළැස්ම කට්ටලය සමඟ අනුකූල විය. එකී ගෘහ නිර්මාණ සැළසුම්වල සත්‍ය පිටපතක් **පී8** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

11. එකී මූලික ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා රජයත් එකී මූලික ගිවිසුමේ එකී තුන් පාර්ශවය, එනම්, කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්, සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්පෝර්ටියම් සංවිධානය සමඟ හවුල් ව්‍යාපාරයකට ඇතුළත් වීම මඟින් එකී හෝටල් ව්‍යාපෘතියට පාර්ශවකරුවෙක් වූ අතර, එම හවුල් ව්‍යාපාරය ඇතුළට නෙරා සෑදුණු ගර්භය සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පණස් දෙකකින් සමන්විත එකී හිල්ටන් හෝටලය ඉදිකිරීම සඳහා එකී තුන් පාර්ශවයන් සහ ශ්‍රී ලංකා රජය විසින් සහ අතර අයෝජන ගිවිසුමක ක්‍රම යෝජනා සකස් කිරීමට මූලික විය. 1984.01.31 දිනැති එකී <u>අයෝජන ගිවිසුමේ</u> සත්‍ය පිටපතක් **පී9** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

12. එකී අයෝජන ගිවිසුමට අනුකූලව ක්‍රියා කරමින්, වෙනත් දේ අතර 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත්වීමම් කිරීමට එකී ආයෝජන ගිවිසුමේ පාර්ශවයන්ට බලයදීමට ද 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කරන ලදී. පැමිණිලිකරු 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් තවදුරටත් ක්‍රියා කළේ ය. සංශෝධනයන් සහිතව එකී සංගාමික සංස්ථා පත්‍රයේ හා ව්‍යවස්ථාවලියේ සහ එම සංශෝධනයන් සමාගම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාට දන්වමින් ඉදිරිපත් කළ අංක.43 දරණ ආකෘති පත්‍රයේ සත්‍ය පිටපත් පිළිවෙලින් **පී10(අ) සහ පී10(ආ)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

13. (අ) එකී මූලික ගිවිසුමේ අරමුණු ඉටුකර ගැනීම පිණිස 1984.01.31 දින හෝ ඊට ආසන්නයේ දී පමණ, ශ්‍රී ලංකා රුපියල් 1,328,584,320.00 මිලකට හෝ මුදලකට සමාන ජපන් යෙන් 11,952,000,000.00 මිළකට හෝ මුදලකට, මිළ නියම කළ ක්‍රියායෝග්‍ය පදනමක් මත, එකී ඉඩම මත වර්ග මීටර් 39,042.3 වන ඉදිකිරීම් බිම් ප්‍රමාණයක් සහිතව ඇතුළට නෙරා සෑදුණු ගර්භ එනම්, ඇතුළට නෙරා සෑදුණු ගර්භ සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකක් අඩංගු තට්ටු විසිදෙකක් වන ජාත්‍යන්තර තරුපහේ පන්තියේ හෝටලයක් ඉදිකිරීම සඳහා 4 වැනි

විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම සමඟ ඉදිකිරීමේ ගිවිසුමකට ඇතුළත් වූයේ ය.

(ආ) එකී හෝටල් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම විස්තර කළ චිත්‍ර සැළසුම් සහ ශිල්පීය නියමාවලියන් එකී ඉදිකිරීම් ගිවිසුමට අමුණා තිබුණු අතර, එකී ඉදිකිරීමේ ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සමන්විත විය. 1984.01.31 දිනැති <u>එකී ඉදිකිරීමේ ගිවිසුමේ</u> සත්‍ය පිටපතක් **පී11** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා අති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

(ඇ) එකී ඉදිකිරීමේ ගිවිසුම අනුව එකී පාර්ශවකරුවන් විසින් සහ අතර එකඟවීම මත එහි අවශ්‍ය කොටසක් ආකාරයට සෑදුණු පොදු කොන්දේසියක්, 1984.01.31 දින ලියා අත්සන් කරන ලදී. එකී ඉදිකිරීම සඳහා වන ගිවිසුම පිළිබඳ එකී <u>පොදු කොන්දේසිවල</u> සත්‍ය පිටපතක් **පී12** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

14. (අ) 1984 ජනවාරි මස 31 දින හෝ ඊට ආසන්නයේ දී පමණ, එකී මූලික ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ මුදලින් රු.206,757,600/- සමාන ජපන් යෙන් 1,860,000,000 වන මිලකට හෝ මුදලකට එකී හිල්ටන් හෝටලයට අවශ්‍ය ගෘහ භාණ්ඩ, සවිකරන භාණ්ඩ සහ උපකරණ සැපයීම සහ භාරදීම සඳහා 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම, 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම සමඟ සැපයීමේ ගිවිසුමකට ඇතුළත් වූයේ ය. එම සැපයීම් ගිවිසුම ඇතුළට නෙරා සෑදුණු ගර්භ එනම්, ඇතුළට නෙරා සෑදුණු ගර්භ සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකක් සමඟ තරුපහේ පන්තියේ ජාත්‍යන්තර හෝටලයක් සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, සවිකරන භාණ්ඩ සහ උපකරණ සැපයීම සඳහා විධිවිධාන සලසා තිබුණි. 1984.01.31 දිනැති <u>එකී සැපයීමේ ගිවිසුමේ</u> සත්‍ය පිටපතක් **පී13** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

(ආ) එම ගෘහ භාණ්ඩ, සවිකරන භාණ්ඩ සහ උපකරණ සැපයීම පිළිබඳ විෂය සීමාව එකී සැපයීමේ ගිවිසුමේ අවශ්‍ය කොටසක් ආකාරයට එම ගිවිසුමට අමුණා තිබූ 'ඒ' ප්‍රදර්ශකයේ විස්තර කර තිබුණි.

15. (අ) 1984 ජනවාරි මස 31 දින හෝ ඊට ආසන්නයේ දී පමණ ශ්‍රී ලංකා රුපියල් 44,464,000/- වන මුදලකට සමාන ජපන් යෙන් 400,000,000 වන මිලකට හෝ මුදලකට, ඇතුළට නෙරා සෑදුණු ගර්භ, එනම් අතුළට නෙරා සෑදුණු ගර්භ සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකක් සහිත ජාත්‍යන්තර තරුපහේ පන්තියේ හෝටලයක් වශයෙන් නියම කළ එකී හිල්ටන් හෝටලය සඳහා <u>සැළසුම් සහ අධීක්ෂණය</u> කිරීම සඳහා 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම 3

වැනි විත්තිකාර ඉහත කී ගෘහ නිර්මාණ ශිල්පීන් සමඟ ගිවිසුමකට ඇතුළත් වූයේ ය. 1984.01.31 දිනැති එකී සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුමේ සත්‍ය පිටපතක් **පී14** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

(ආ) තවද, 3 වැනි විත්තිකාර නිර්මාණ ශිල්පි සමාගම එකී සැපයීම ගිවිසුම යටතේ කරුනු ලබන සැපයීම්වල තත්ත්වය සහ නියමාවලියන් එකී සැපයීම් ගිවිසුමෙ නියම කළ පරිදි අධික්ෂණය කිරිමට එකඟව භාර ගත්තේ ය.

16. (අ) 1964 ජනවාරි මස 31 දින හෝ ඊට ආසන්නයේ දී පමණ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය විසින් ගෙවනු ලැබිය යුතු ශ්‍රී ලංකා රුපියල් 1,367,268,000/- මුදලකට සමාන වන ජපන් යෙන් 12,300,000,000 වන ණය මුදලක් සඳහා 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය සමඟ ණය ගිවිසුමකට ඇතුළත් වූයේ ය. ණය මුදලින් ලැබෙන මුදල් එකී ඉදිකිරිමේ ගිවිසුම යටතේ ඇතුළට නෙරා සෑදුණු ගර්භ සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකකින් සමන්විත එකී තරුපහේ පන්තියේ හෝටලය ඉදිකිරිම වෙනුවෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයට එකී සැපයීම් ගිවිසුමේ විස්තර කර ඇති භාණ්ඩ සැපයීම සහ භාරදීම වෙනුවෙන් 1 වැනි විත්තිකාර මිට්සූයි සමාගමට සහ එකී සැළසුම් සහ සැපයීම් ගිවිසුම යටතේ සැළසුම් සහ අධික්ෂණ සේවාවන් සඳහා 3 වැනි විත්තිකාර සමාගමට ගෙවීම වෙනුවෙන් ප්‍රයෝජනයට ගතයුතු බවට එකී ණය ගිවිසුමෙහි නියම කර තිබුණි. එකී ණය ගිවිසුමේ සත්‍ය පිටපතක් **පී15** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

(ආ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය විසින් ගෙවිය යුතු ණය අත්තිකාරම් මුදල්, ඉදිකිරිමේ සහ සැපයීම් වෙනුවෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයට එම ණය අත්තිකාරම් මුදල්වලින් කළයුතු ගෙවීම් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයට අර්ධ වාර්ෂික වාරික විසි හතරකින් අවුරුදු 12 ක කාලසීමාවක දී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් පොළිය සමඟ නැවත ගෙවනු ලැබිය යුතු ණය මුදල් පෙන්වමින් 'එ', 'බී' සහ 'සී' ලකුණු කළ ඇමුණුම් මෙම ණය ගිවිසුමේ අඩංගු විය.

(ඇ) අවුරුදු දොළහක් ඇතුළත විසිරිගිය පොළිය සමඟ එකී ණය නැවත ගෙවන අර්ධ වාර්ෂික වාරික විසි හතර එකී හිල්ටන් හොටෙල් ව්‍යාපෘතිය වෙනුවෙන් 1 වැනි විත්තිකාර මිට්සූයි සමාගම විසින් ක්‍රමවත්ව දක්වන ලද සහ ඉදිරිපත් කරන ලද

මුදල් ගැලීම් සහ ලාබ උපදන ප්‍රක්ෂේපණ සමග අනුකූල විය. <u>මෙම ලාභ උපදන ප්‍රක්ෂේපණ අමුත්තන්ගේ කාමර භාරසිය පනස් දෙකක් වන පදනම මත ගණන් පිළියෙල කර තිබුණි.</u> එකී ලාභ උපදවන පූර්වානුමාන ප්‍රකාශයේ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයේ සත්‍ය පිටපතක් **පී16** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටසක් වශයෙන් සැළකර සිටියි.

17. (අ) ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම සහ සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම යන ගිවිසුම්වලට යාකොට තිබූ අමුණුම් ප්‍රකාර එකී ගිවිසුම් යටතේ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සමාගමේ සහ 3 වැනි විත්තිකාර නිර්මාණ ශිල්පී සමාගමට, ඒකාන්ත වශයෙන් කළ වැඩකටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ නියම සහතික කිසිවක්වත් නිකුත් නොකරම මුදල් ගෙවිය යුතුව තිබුණි.

(ආ) ඉහත 17(අ) ඡේදයෙහි සඳහන් කළ ගෙවීම් ටෝකියෝ නුවර, ෆුජි බෑන්ක් බැංකුවේ මෙම අරමුණ සඳහාම විවෘත කළ 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම නමින් පවත්වාගෙන ගිය බැංකු ගිණුමක් මඟින් ක්‍රියාත්මක කරන ලදී. එකී ණය ගිවිසුමට අරමුණ තිබූ ණය මුදල උපයන උපලේඛණය අනුව, මුදල් ණයට සපයන්නන් වශයෙන් 1 වැනි සහ 2 වැනි විත්තාකර මිට්සුයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය පළමුව එකී බැංකු ගිණුමට කලින් මුදල් තැන්පත් කළ අතර, 3 වැනි විත්තිකාර නිර්මාණ ශිල්පීන්ට කරන ගෙවීම් අත්හැර, එකී ඉදිකිරීම් ගිවිසුම, සැපයීම් ගිවිසුම සහ සැළසුම් අධීක්ෂණ ගිවිසුම යන ලියවිලිවලට අමුණා තිබූ ඇමුණුම් අනුව එවැනි ගෙවීම් සිදු කිරීමට 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් දෙනු ලැබූ නියත උපදෙස්වල පදනම මත මූලිකව මිට්සුයි තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය විසින්ම ඉහත සඳහන් ගෙවීම් එවේලේම ලබාගන්නා ලදී. එම තීරණය 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂකරුන් විසින් ගන්න ලද තීරණයකි.

18. එකී ආයෝජන ගිවිසුමේ එකග වූ නියමයන් හා කොන්දේසි අනුව ශ්‍රී ලංකා රුපියල් 1,367,268,000/- වන මුදලකට සමාන ජපන් යෙන් 12,300,000,000 වන මුදල ඊට සමාන මුදලකින් ශ්‍රී ලංකා රජය විසින් සැපයිය යුතු බවට එකී ණය ගිවිසුමේ නියම කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රුපියටල් 1,367,268,000/- වන මුදලකට සමාන ජපන් යෙන් 12,300,000,000 වන එකී ණය මුදල 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට නැවත ගෙවිම සඳහා ශ්‍රී ලංකා රජය ඇප විය. එකී ඇපවීමේ ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී17ඒ සහ පී17බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

19. (අ) පී11, පී13, පී14 සහ පී15 ලෙස පිළිවෙළින් ලකුණු කර ඇති ආයෝජන ගිවිසුම, ඉදිකිරීමේ ගිවිසුම, සැපයීම් ගිවිසුම, සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම සහ ණය ගිවිසුම යන ලියවිලි 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී <u>සභාගත කර, අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද අතර,</u> එකී ගිවිසුම් එකී හෝටලය තට්ටු විසි දෙකක් උස, ඇතුළට නෙරා සෑදුණු ගර්භ එනම්, ඇතුළට නෙරා සෑදුණු ගර්භ සහිත අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකකින් අඩංගු වියයුතු බවට විස්තර කර තිබුණු බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

(ආ) එකී නෛතික ගිවිසුමේ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ නීතිඥ මහතුන් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයේ නීතිඥ මහතුන් විසින් සහ අතර ක්‍රමයෝජනා සකස් කර නිමකරන ලද බව එහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය සටහන් කර ගන්නා ලදී. එකී නෛතික ගිවිසුම් සහ ලියකියවිලි මෙම අරමුණ සඳහාම ශ්‍රී ලංකා රජය සඳහා සහ වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් සේවා පිණිස තබාගත් ජපානයේ ටෝකියෝ නුවර නීතිඥ හමාඩා සහ මට්සුටොටෝ ආයතනයේ සියුම් පරික්ෂාවට සහ අනුමැතියට භාජනය වූ බවත් ශ්‍රී ලංකාවේ ගරු නීතිපතිතුමාත් විසින් අනුමත කරන ලද බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සටහන් කරගෙන ඇත.

(ඇ) එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 1 වැනි විත්තිකාර මිට්සූයි සමාගම විසින් පිළියෙල කරන ලද සහ ඉදිරිපත් කරන ලද 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ මුදල් සැලසුම් නිර්මාණය වන, අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකේ පදනම මත ගණන් බැලූ <u>අවුරුදු දොළහක කාලසීමාවක් සඳහා වන</u> ලාභ උපයන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණය සභාගත කරන ලදී.

(ඈ) තවද, යෝජිත හෝටලය නිව්යෝර්ක් නුවර හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් නියම කරනු ලබන යම් තත්ත්වයකට එකග වන පරිදි තරුපහේ පන්තියේ තත්ත්වයට ගොඩනැගිය යුතු අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකකින් සමන්විත හෝටලයක් වියයුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය සටහන් කර ගන්නා ලදී.

(ඉ) 3 වැනි විත්තිකාර නිර්මාණ ශිල්පි සමාගම විසින් පිළියෙල කරන ලද ඉදිකිරීමේ සැළසුම් චිත්‍ර සමඟ සම්පූර්ණ ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් ද එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරන ලද අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ කොන්සෝර්ටියම් සමාගමත් සමඟ කිට්ටු සහයෝගයෙන් සහ සහභාගීත්වයෙන් හොටෙල් ව්‍යාපෘතිය වැඩිදියුණු වෙමින් පැවති බව අධ්‍යක්ෂ මණ්ඩලය සටහන් කර ගන්නා ලදී. 1984.01.07 සහ 1984.01.31 දින පැවැත්වූ

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී18ඒ සහ පී18බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

20. (අ) 1984 මාර්තු මස 26 වන දින හෝ ඊට ආසන්නයේ දී පමණ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම එකක් රුපියල් දහයක් වන සාමාන්‍ය කොටස් 11,947,505 එනම් රුපියල් 119,475,050/- වෙනුවෙන් මහජන කොටස් නිකුතුව සඳහා ප්‍රකාශ පත්‍රයක් නිකුත් කළේ ය.

(ආ) එකී ප්‍රකාශ පත්‍රයේ නම්කර තිබු ප්‍රවර්ධකයන් කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්, ඩෙල්මේජ් ෆෝසයිත් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් (1 වැනි විත්තිකාර) ජපානයේ මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සහ (2 වැනි විත්තිකාර) ජපානයේ තායිසෙ කෝපරේෂන් යන සමාගම් වූවෝ ය.

(ඇ) ප්‍රකාශ පත්‍රයෙහි 8 වැනි පිටුවේ පෙනෙන, එහි දක්වා ඇති පරිදි ගොඩනැගීමට තිබු එකී හිල්ටන් හෝටලයේ මූලික අංග ලක්ෂණ, තට්ටු විසිදෙක දක්වා විහිදි යන කාමර හාරසිය පනස් දෙකකින් යුක්ත අටල්ල සංකල්පය ඉදිකිරිමක් විය යුතුව තිබුණි. විස්තර කර තිබු වෙනත් ලක්ෂණයන් අතර, වාහන 400 දක්වා නවතා තැබීමට ඉඩ පහසුකම් ද ආවරණය විය.

21. (අ) ව්‍යාපෘතිය ක්‍රමයෝජනා සකස්කර දීම සහ ක්‍රියාත්මක කිරිම පිළිබඳ අවසාන අදියර සම්බන්ධව ජපානයෙන් පැමිණි මිට්සුයි/තායිසෙ සංවිධානයේ නිළධාරින් ගණනාවක්, විශේෂයෙන් 1983 වර්ෂයේ අවසාන භාගයේ සිට ලංකාවේ සිටියේ ය. ව්‍යාපෘතිය යෝජනා ක්‍රම සකස් කිරිමේ වැඩකටයුතු, ලියකියවිලිවල කටයුතු කිරිම, සාකච්ඡා කර නියම කර ගැනීම සහ ගිවිසුම් සමථයකට පත් කිරිම ආදියට සම්බන්ධ කටයුතු සියල්ල කළ ප්‍රධාන නිළධාරියා වූයේ එකී ව්‍යාපෘතිය ක්‍රම යෝජනා සකස් කිරිම, කරුණු සාකච්ඡා කර නියම කර ගැනිම සහ සංවර්ධන කටයුතු සම්බන්ධව කලින්කලට ලංකාවට පැමිණ සිටි මිට්සුයි සමාගමේ අකියෝ කටෝ ය.

(ආ) අනෙක් විදේශ සේවකයින් අතර, මිට්සුයි සමාගමේ කේ.ෆුකුෂි සහ ජේ.කොජිමා යන දෙදෙනා, තායිසෙ සමාගමේ ටෝරු කොසුගි සහ සිව් සිනෝහරා යන දෙදෙනා කේ.කේ.එස්. හි කෙන්සො වටන්බි හා ටොමියො ඔකබි යන දෙදෙනා මිට්සුයි සමාගමේ නීතිඥ ෆර්ගුස් පොල් රූනි, තායිසෙ සමාගමේ නීති දෙපාර්තමේන්තුවේ මසුෆුමි අනාමි යන අය මෙම කාලය තුළ දී එකී, ඒ.කටෝ සමඟ ක්‍රියාකාරි ලෙස සම්බන්ධ වී සිටි සමහර නිළධරයෝ වෙති.

22. (අ) 1984 මාර්තු මස හෝ ඊට ආසන්නයේ දී පමණ 1 වැනි සහ 2 වැනි වින්තිකාර මිට්සුයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානය 3 වැනි වින්තිකාර නිර්මාණ ශිල්පි සමාගමේ අධීක්ෂණය යටතේ ඉදිකිරීමේ ගිවිසුම ප්‍රකාර එකී හිල්ටන් හෝටලය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළෝ ය.

(ආ) එකී හිල්ටන් හෝටලයේ ඉදිකිරීමේ කටයුතු කිරීමට පෙර, 1983 ඔක්තෝබර් මස 19 වන දින හෝ ඊට ආසන්නයේ දී පමණ එකී හිල්ටන් හෝටලයේ ගෘහ නිර්මාණ සැළසුම් ව්‍යවස්ථාපිත අනුමැතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ 1983.10.19 දිනැති ගෙවිලි තුංඩුවේ සත්‍ය පිටපතක් **පී19** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) එකී ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් 1984.01.07 වන දින 4 වැනි වින්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී සභාගත කළ අතර, හෝටලය අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකකින් සමන්විත වියයුතු බවටත්, තවද එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරන ලද 1 වැනි වින්තිකාර මිට්සුයි සමාගම විසින් පිළියෙළ කරන ලද ලාභ උපදින පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් අමුත්තන්ගේ කාමර හාරසිය පනස්දෙක යන පදනම මත ගණන් බලා තිබූ බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සටහන් කරගෙන තිබුණි.

(ඈ) ගිනි නිවන හමුදාව ඇමතූ 1984.01.19 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ ලිපියෙන් සාක්ෂි දරණ පරිදි, එකී ගෘහ නිර්මාණ සැළසුම් කඩදාසි විසි හතකින් සමන්විත වී ඇත.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරියේ 1984.03.23 දිනැති ලිපිය පරිදි එකී ගෘහ නිර්මාණ සැළසුම් නාගරික සංවර්ධන අධිකාරිය අනුමත කර තිබුණි. 1984.01.19 සහ 1984.03.23 දිනැති එකී ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී20ඒ සහ පී20බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

23. (අ) පැමිණිලිකරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ 1985.07.22 දිනැති ඔහුගේ ලිපියෙන් වෙනත් දේ අතර, ව්‍යාපෘතික ඉදිකිරීමට එරෙහිව සමීක්ෂණය කළ ඉදිකිරීම් පිළිබඳ ප්‍රගතිය පෙන්වන වාර්තා 3 වැනි වින්තිකාර ගෘහ නිර්මාණ සමාගමෙන් සහ 1 වැනි සහ 2 වැනි වින්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයෙන් ඉල්ලා සිටියේ ය. 1985.07.22 දිනැති එකී ලිපියේ සත්‍ය පිටපතක් සහ 1985.07.25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් පිළිවෙලින් **පී21ඒ**

**සහ පී21බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

(ආ) පැමිණිලිකරුට ඉල්ලා සිටි වාර්තා හෝ ඉහත 23(අ) ඡේදයෙහි සඳහන් කළ ඔහුගේ ඉල්ලීමට කවර පිළිතුරක් හෝ නොලැබුණි.

24. ඒ වෙනුවට එකී හිල්ටන් හෝටල් බිමේ පිහිටා තිබූ මිට්සුයි තායිසෙ සංවිධාන වැඩබිම් කාර්යාලයයේ <u>ගින්නක්</u> ඇති වූ බවට 1985.10.18 දින හෝ ඊට ආසන්නයේ දී පමණ මිට්සුයි/තායිසෙ සංවිධානය නියෝජනය කරන විධායක අධ්‍යක්ෂ ඒ.නකා මහතා වාර්තාවක් ඉදිරිපත් කළ අතර, එය 1985.10.30 දිනැති ලිපිය අනුව, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. <u>සියලු සැළසුම් චිත්‍ර සහ ලියවිලි ගිනිගත් බවත්,</u> 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි තායිසෙ සංවිධානයේ ටෝකියෝ නුවර සිටින ප්‍රධානීන් සියලු සැළසුම් චිත්‍ර සහ ලියවිලිවල පිටපත් පිටපත්කොට එවා ඇති බවත් හිල්ටන් හොටෙල් ව්‍යාපෘතියේ වැඩකටයුතු නැවත ආරම්භ කර ඇති බවත් වාර්තාව ප්‍රත්‍යක්ෂ වශයෙන්ම ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ ප්‍රධානීන් විසින් නැවත සපයා තිබූ එකී සැළසුම් චිත්‍ර සහ ලියකියවිලි, ඉදිකිරීමේ ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් සකස් වී තිබුණු මුල් අනුමත කළ ගෘහ නිර්මාණ සැළැස්මවලට <u>අනුකූල නොවන බව</u> පැමිණිලිකරු දැනගත්තේ 1990 මාර්තු මාසයේදී පමණි. 1985.10.30 දිනැති එකී ලිපියේ සහ එයට අමුණා තිබූ ගින්න සම්බන්ධ වාර්තාවේ සත්‍ය පිටපතක් **පී22ඒ සහ පී22බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

25. 1987 අප්‍රේල් මස 30 වන දින එකී හිල්ටන් හෝටලයේ යතුරු හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයට භාරදීම පිළිබඳව 1987.06.06 දින හෝ ඊට ආසන්නයේදී පමණ 5 වැනි විත්තිකරු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළේ ය. 1987.06.08 වෙනි දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් **පී23** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

26. (අ) මෙහෙයුම් කටයුතු සඳහා 1987.07.01 දින එකී හිල්ටන් හෝටලය විවෘත කිරීමෙන් පසුව, එකී හිල්ටන් හෝටලය පිළිබඳව ප්‍රතිශෝධිත ලාභ උපදවීමේ පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගලන ප්‍රක්ෂේපණය 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම සිය සමාගමේ ඇම්.කුබෝටා මහතා විශේෂයෙන්ම කොළඹට එව්වේ ය.

(ආ) එකී ඇම්.කුබෝටා, එකී හිල්ටන් හෝටලයේ ලාභ උපදවීමේ පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගලන ප්‍රක්ෂේපණය පිළිබඳව 1987.07.15, 1987.11.12 සහ 1987.11.18 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත්වූ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ

මණ්ඩල රැස්වීම්වලට ආරාධනය පිට සහභාගි විය. 1987.07.15, 1987.11.12 සහ 1987.11.18 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී24ඒ, පී24බී සහ පී24සී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) 1987.06.26 දිනැති 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද අවුරුදු විසිහතරකට විසිරි ගිය එකී ප්‍රතිශෝධිත ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගලන ප්‍රක්ෂේපණයන් එකී හිල්ටන් හෝටලය මෙහෙයුම් සඳහා විවෘත කළ අවස්ථාවේ හෝටල කර්මාන්තයේ පැවති තත්ත්වයන් නිසා කාමර පදිංචිය පිළිබඳ පහළ අනුපාතය සහ සමානාය කාමර අනුපාතය සැළකිල්ලට භාජනය කර තිබුණි. <u>එහෙත් එකී ගණන් බැලීම අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙක මත පදනම් විය.</u>

(ඈ) 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද 1987.06.26 දිනැති එකී ප්‍රතිශෝධිත ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශයන් සහ මුදල් ගැලීමේ ප්‍රක්ෂේපණ ගැන හොඳින් කල්පනා කොට බැලීමේ දී සහ ගුණදොස් විවේචනය කර බැලීමේ දී සහ හෝටලය මෙහෙයුම පිළිබඳ පළමු මාස කීපය සඳහා වන හිල්ටන් කළමණාකාර ප්‍රකාශ වලින් හඟවන ලද පරිදි හිල්ටන් හෝටලය ඇත්ත වශයෙන් කළ වැඩ සමඟ මෙම ගණන් සංසන්දනය කරන විට, <u>1 වැනි විත්තිකාර සමාගම ලාභ උපදින ප්‍රක්ෂේපණ අමුත්තන්ගේ කාමර හාරසිය පනස් දෙකක පදනම මත ගණන් බලා තිබූ අතර, හිල්ටන් මාසික ප්‍රකාශයේ කාමර තුන්සිය අසූ හතක් පමණක් වශයෙන් ප්‍රතිබිම්බිතව දක්වා තිබෙන බව දැන ගත්තේ ය.</u>

(ඉ) 1 වැනි විත්තිකාර මිට්සූයි සමාගමේ නියෝජිත එම් කුබොටා මහතාට මෙම වෙනස පැහැදිලි කිරිමට නොහැකි වූ අතර, කෙසේ වෙතත් ඊට පසුව මවාගත්, ඔහු අමුත්තන්ගේ කාමර තුන්සිය අසූහත පදනම මත නැවත ගණන් බැලූ තවත් ප්‍රතිශෝධිත ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශයක් සහ මුදල් ගැලීමේ ප්‍රක්ෂේපණයන් ඊට පසුව ඉදිරිපත් කළේ ය. හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයෙන් ලැබුණු මාසික ලසු වාර්තා, 1 වැනි විත්තිකාර මිට්සූයි සමාගම විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධිත ලාභ උපදන සහ මුදල් ගැලිමේ ප්‍රක්ෂේපණයන් සහ 1 වැනි විත්තිකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද නැවත ගණන් බැලූ ප්‍රතිශෝධිත ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශයන් සහ මදුල් ගලන ප්‍රක්ෂේපණයන්වල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී25ඒ, පී25බී සහ පී25සී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

27. (අ) පැමිණිලිකරු මෙම වෙනස අධ්‍යක්ෂ මණ්ඩලයේ සැළකිල්ලට භාජනය කළ අතර, සමහර අවශ්‍යම සහ වැදගත් කරුණු විශේෂයෙන්ම අමුත්තන්ගේ කාමර තුන්සිය අසූහත සියයට සියයක කාමර පදිංචිය තිබුණත්, සහ එක අමුත්තෙකුගේ කාමරයකට ඇමරිකානු ඩොලර් 100 සාමාන්‍ය කාමර අනුපාතයක් බැගින් වුවත්, කාමර 387 පදනම මත එකී සම්පූර්ණ ණය මුදල නැවත ගෙවීමට එය ඉතාමත් නොහැකි වන්නේ යැයි දක්වමින් 1987.12.30 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ලියවිල්ලක් ඉදිරිපත් කළේ ය.

(ආ) පැමිණිලිකරු 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයෙන් මෙම කරුණු මත පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වන බව උදක්ම කියා සිටි නිසා, විධායක අධ්‍යක්ෂ, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ එක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී කළ සාකච්ඡා සහ 1997.12.30 දිනැති එකී අධ්‍යක්ෂ මණ්ඩල ලියවිල්ලේ අඩංගු කරුණු දැන සිටි එච්.ඔගාමින් සහභාගී වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි තායිසෙ සංවිධානය අමතා ලිපියක් කෙටුම්පත් කිරීමට අනෙක් අධ්‍යක්ෂකවරුන් විසින් පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටින ලද බව පැමිණිලිකරු සැළකර සිටියි.

(ඇ) 1988.01.13 දින හෝ ඊට ආසන්නේයේදී පමණ පැවැත්වූ ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පැමිණිලිකරු එම ලිපියේ කෙටුම්පතක් සභාගත කළ අතර, එහි ඇතුළට නෙරාගිය අමුත්තන්ගේ කාමර ගර්භ ගණන පිළිබඳ වෙනෙස සහ එකී සම්පූර්ණ ණය මුදල ගෙවීම පිළිබඳ ඉතාමත් නොහැකිකම එහි ඇතුළත් විය.

(ඈ) සභාපති සහ කළමණාකාර 5 වැනි විත්තිකාර කෝර්නල් ලයනල් පෙරේරා සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ කොන්සෝර්ටියම් සංවිධානයේ නියෝජිත විධායක අධ්‍යක්ෂ එම්.ඔගාමි එකී කෙටුම්පත් ලිපිය ගුණදොස් විවේචනය කර අවසාන කෙටුම්පත් ලිපියක් සූදානම් කළයුතු බවත්, එකී රැස්වීමට නොපැමිණි 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ දෙදෙනා වන එෆ්.ජී.එන්.මැන්ඩිස් සහ කේ.එම්.චොක්සි මහතුන්ට ඔවුන්ගේ එකඟත්වය සඳහා අවසාන කෙටුම්පත් ලිපිය යැවිය යුතු බවත්, ඊට පසුව එම ලිපිය මිට්සුයි/තායිසෙ සංවිධානය වෙත යැවිය යුතු බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේ ය.

(ඉ) 1988 ජනවාරි 14 දිනැති එකී ලිපිය සියලු අධ්‍යක්ෂකවරුන්ගේ අනුමැතිය ඇතිව තැපැල් කර යවා ඇති බව 1989.01.28 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත්වූ අනික් අධ්‍යක්ෂ මණ්ඩලයේ දී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්.පෙරේරා වාර්තා

කළේ ය. අමුත්තන්ගේ කාමර ගර්භවල වෙනස පිළිබඳ විෂය කරුණ සහ එකී සම්පූර්ණ ණය මුදල ගෙවීමට ඇති අපහසුකම යන කරුණ ඇතුළත් විය. 1987.12.30, 1988.01.13 සහ 1988.01.23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා 1987.12.30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල ලිපිය, 1988.01.13 දින සභාගත කළ ලියුම් කෙටුම්පත සහ 1988.01.14 දිනැති අවසාන ලිපිය යන ලියවිලිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **26ඒ, 26බී, 26සී, 26ඩී, 26ඉ සහ 26එෆ්** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

28. (අ) මතු කළ ප්‍රශ්ණවලට ප්‍රතිචාර වශයෙන්, 1988.01.14 දිනැති එකී ලිපියට 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයෙන් ලැබුණු පිළිතුර 1988.01.29 දිනැති ටෙලෙක්ස් පණිවුඩයක් විය. එකී ටෙලෙක්ස් පණිවුඩයේ නිදහසට කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට උත්සහා කර තිබූ අතර, එය අවුල්සහගත එකක් වූ අතර, එය විෂයගත කාරණය පැහැදිලි නොකළේ ය. කෙසේ වෙතත්, වෙනත් දේ අතර, මුල් සැළැස්මේ අමුත්තන්ගේ කාමර ගර්භ හාරසිය පණස් දෙක පරිදි කර තිබූ කාමර ගර්භ සංඛ්‍යාවේ වෙනසක් නොවූ බව ටෙලෙක්ස් පිණිවුඩය ස්ථිර කළේ ය.

1988.01.29 දිනැති එකී ටෙලෙක්ස් පණිවුඩයේ සත්‍ය පිටපතක් **පී27** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ආ) පසුව 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත, විධායක අධ්‍යක්ෂ එච්.ඔගාමි 1988.02.01 දිනැති ප්‍රතිශෝධිත ලාභ උපදවීමේ පූර්වානුමාණ ප්‍රකාශයක් සහ මුදල ගැලීමේ ප්‍රක්ෂේපණයක්, මෙම ලාභ උපදවීමේ පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීමේ ප්‍රක්ෂේපණයන් අමුත්තන්ගේ කාමර තුන්සිය අසූහත මත පදනම් වූ බව පැහැදිලිව දක්වන අමුණා තිබූ ලියවිල්ලක් ද ඇතිව ඉදිරිපත් කළේ ය. එකී 1988.02.01 දිනැති ප්‍රතිශෝධිත ලාභ උපදවීමේ පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල ගැලීමේ ප්‍රක්ෂේපණයේ සත්‍ය පිටපතක් **පී28** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) මෙම අවස්ථාවේදීත්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නොමඟ යැවීමට උත්සහා කළබව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

29. (අ) පැමිණිලිකරු එකී නිදහසට ඉදිරිපත් කල කරුණු සහ කරුණු පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් සතුටට පත්නොවී, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු වන ශ්‍රී ලංකා රජයෙන් එවකට පත් කළ එම්.ටී.එල්.ප්‍රනාන්දු සහ ආචාර්ය ඒ.සී.රන්දෙනි යන දෙදෙනා සමඟ (අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම අනුව) ලාභ උපදවීමේ පූර්වානුමාන ප්‍රකාශ මුදල් ගලන ප්‍රක්ෂේපණයන් ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධව සැක පහළ කළෝ ය.

(ආ) කරුණු තිබෙන හැටියට සම්මාන වරලත් ගණකාධිකාරිවරයෙකු සහ අර්නස්ට් සහ යං ආයතනෙය් ප්‍රධාන හවුල්කාර) එකී එම්.බී.එල්.ප්‍රනාන්දු මහතා, එකී හිල්ටන් හෝටලයේ ගොඩනැගිල්ල සහ එහි සවිකර ඇති යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර අවසාන පරික්ෂණයට භාජනය කර ඒ මත වාර්තා කිරීමේ අරමුණ ඇතිව ස්වාධීන ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබාගැනීම දූරදර්ශී වන බව 1988.05.25 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී යෝජනා කළ අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය වන කොන්ත්‍රාත්කරුවන් සමඟ ඉහත නම සඳහන් ගෘහ නිර්මාණ ශිල්පි 3 වැනි විත්තිකාර සමාගම අනුමාන වශයෙන් සම්බන්ධකම ඇති බව තවදුරටත් විවේචනය කරමින් ප්‍රකාශ කළේ ය. 1988.05.25 දිනැති එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් **පී29** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත එවකට අධ්‍යක්ෂ එච්.ඔගාමි, මෙම යෝජනාවට විරුද්ධ වූ නිසා, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මෙම රැස්වීමට නොපැමිණ සිටි කේ.එන්.චොක්සි මහතාගේ උපදෙස් ලබාගැනීමට තීරණය කරන ලදී.

30. (අ) ස්වාධීන ඉංජිනේරුවරයෙකු විසින් පරික්ෂා කරනු ලැබීම පිළිබඳ කාරණය 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ කේ.එන්.චොක්සි මහතාගේ උපදෙස් බලාපොරොත්තුවෙන් පැවතුණි. ගොඩනැගිල්ල පිළිබඳ අවසාන පරික්ෂණය 1988.03.24 සහ 25 වැනි දිනවල පවත්වා ඇති බවට වාර්තා වී තිබූ නමුත්, 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම විසින් ඒ වනතෙක් අවසාන සහතිකය නිකුත් කර නොතිබුණි.

(ආ) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගමට අතිරේකව, ස්වාධින ඉංජිනේරුවකු විසින් පරික්ෂණයක් කිරීම පිළිබඳ ප්‍රශ්නය මත 1988.08.08 දිනැති, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ කේ.එන්.චොක්සි මහතාගෙන් ලැබුණු ලිපියක් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ

සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්.පෙරේරා 1988.08.12 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරන ලද අතර කේ.එන්.වොක්සි මහතාගේ එකී ලිපිය වෙනත් දේ අතර, පහත සඳහන් පරිදි ද ප්‍රකාශ කරන ලදී.

''මාගේ අදහස අනුව මෙය අවශ්‍ය බව නොපෙනේ. 'වැඩ අවසාන කිරීම මත පරීක්ෂණයක්' පැවැත්වීමට සහ එවැනි පරීක්ෂණයක් කිරීමෙන් පසුව සෑහීමට පත්වූයේ නම්, ඉදිකිරීම් වැඩ පිළිගත හැකි බවට වැඩ අවසන් සහතිකය නිකුත් කිරීමට ගෘහ නිර්මාණ ශිල්පියාට 16 වැනි වගන්තිය නියම කරයි. මෙය ගෘහ නිර්මාණ ශිල්පින් කර ඇත. ගෘහ නිර්මාණ ශිල්පින් අයිතිකරුගේ නියෝජිතයා සහ මෙම අරමුණ සඳහා තාක්ෂණික උපදේශක වන අතර, ඔහුගේ පරීක්ෂණය සහ සහතික කිරීම ඉදිකිරීමේ වැඩ සෑම ආකාරයකින්ම නිසි පිළිවෙළට තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමිකරුවන්ට යන දෙකොට්ඨාශයටම සෑහෙන ආරක්ෂාවක් වෙයි. ගෘහ නිර්මාණ ශිල්පියාගේ සහතිකය මත විශ්වාසය තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හිමිකම තිබේ.

ගෘහ නිර්මාණ ශිල්පියාගේ කාර්යක්ෂමතාව හෝ අවංකකම සැක කිරීමට යම් හේතු හෝ කරුණු ඇත්නම් පමණක් කොටස් හිමිකරුවන් නාමයෙන් ස්වාධීන වාර්තාවක් ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමෙන් බැඳී සිටින්නේ ය. නොඑසේ නම්, එසේ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍යතාවයක් නැතුවා පමණක් නොව වෙනත් වාර්තාවක් ලබා ගැනීමට වැඩිදුර වියදම් කිරීමක් සාධාරණ නොවන්නේ ය. ඇරත් කොන්ත්‍රාත්කරුවන් ගැන සලකා බලන විට ඔවුන් එවැනි වාර්තාවකින් නොබැඳෙන්නේ ය.''

එකී කේ.ඇන්.වොක්සි මහතාගේ 1986.08.08 දිනැති ලිපියේ සත්‍ය පිටපතක් සහ 1988.08.12 දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවේ සත්‍ය පිටපතක් පිළිවෙලින් **පී30ඒ සහ පී30බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) මෙම පසුබිම යටතේ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධින ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා නොගැනිමට තීරණය කර ලදී. 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත විධායක අධ්‍යක්ෂ එච්.ඕගම් මහතා ස්වාධීන ඉංජිනේරුවරයෙකු එක් කිරීම ගැන විරුද්ධ විය. කෙසේ වෙතත්, පැමිණිලිකරු මෙම තීරණය සුදුසු නොවන බවට සිතු නමුත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය වෙනස් කළ නොහැකි විය.

(ඈ) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම නිකුත් කරන ලද වැඩ අවසන් කිරිමේ සහ අවසාන සහතිකයේ ප්‍රමාණවත් නොවීම ගැන පැමිණිලිකරු විසින් දැන ගැනීමෙන් පසුව පැමිණිලිකරු විසින් කරුණු ඉදිරිපත් කිරිමෙන් අනතුරුව සහ 4 වැනි විත්තිකාර සමාගම වන හොටෙල් ඩෙවලොපර්ස් සමාගම, ශ්‍රී ලංකා රජයෙන් පත්කළ අධ්‍යක්ෂවරයෙකු වන කේ.ෂන්මුගලිංගම් මහතාගේ යෝජනාවක් මත මෙරට ගෘහ නිර්මාණ ශිල්පි ඉංජිනේරුවරයෙකුගේ ද උපකාරය සහ සේවය ලබා ගැනිමට පැමිණිලිකරු බලය පවරන ලදී. ඉහත සඳහන් කළ 1987.04.30 දින දරණ වැඩ අවසන් සහතිකයේ සහ 1988.08.25 දින දරණ අවසාන සහතිකයේ සත්‍ය පිටපත් පිළිවෙලින් **පී31ඒ සහ පී31බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

31. (අ) එමනිසා ශ්‍රී ලංකා රජයෙන් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට පත්කළ අධ්‍යක්ෂ කේ.ෂන්මුගලිංගම් මහතා විසින් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරන ලද යෝජනාවට අනුකූලව මෙම කරුණ තවදුරටත් සොයා බැලීමට මෙරට ගෘහ නිර්මාණ ශිල්පි ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනිමට ඉහත කී 4 වැනි විත්තිකාර සමාගම වන හොටෙල් ඩෙවලොපර්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැමිණිලිකරු වෙත දෙන ලද බලය මත පැමිණිලිකරු විසින් ෂෙල්ටන් විජේරත්න, විලියම්ස් ඇන්ඩ් ඇසෝසියේට්ස් ආයතනයෙහි එෆ්.අයි.ඒ. (ශ්‍රී ලංකා) ඒ.ආර්.අයි.බී.ඒ, ඒ.ඒ. ඩිප්ලෝමා (ලන්ඩන්) ඒ.අයි. (අරාබි) යන සුදුසුකම් ලත් ෂෙල්ටන් විජේරත්න මහතාගේ සේවය ලබාගන්නා ලදී. ෂෙල්ටන් විජේරත්න මහතා ශ්‍රී ලංකාවේ වරලත් ගෘහ නිර්මාණ ශිල්පි ආයතනෙය් සභාපති වශයෙන් ද වරෙක කටයුතු කර ඇති ජ්‍යෙෂ්ඨ වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන අතර, හෝටල් කර්මාන්තයේ ඉතා පුළුල් සහ විවිධ අත්දැකීම් ඔහු සතු වේ.

(ආ) 1983 දී නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කරන ලදුව 1984 මාර්තු මාසයේ දී අනුමත කරන ලද ඉහත සඳහන් කළ පරිදි මුල් ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් ලබා ගැනිමට පැමිණිලිකරු විසින් දරණ ලද ප්‍රයත්නයන් වලින් මෙතෙක් කිසිදු ප්‍රතිඵලයක් නොලැබුණු නිසා ගෘහ නිර්මාණ ශිල්පින් (3 වැනි විත්තිකරු) විසින් අවසන්කොට 1980 ජූලි මාසයේ දී ඉදිරිපත් කරන ලද මුල් ගෘහ නිර්මාණ සැළසුම් සහ සැළසුම් චිත්‍ර පදනම් කරගෙන විෂය කරුණ තවදුරටත් සෙවීමේ කටයුතු පැමිණිලිකරු විසින් කර ඇත.

(ඇ) මෙහි ඉහත කලින් දැනටමත් දක්වා ඇති පරිදි 1981 අගෝස්තු මස ඉදිරිපත් කරන ලද හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයෙහි ආදායම් සහ වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශය පදනම් වී තිබුනේ අමුත්තන්ගේ කාමර මහල් 19 ක <u>අමුත්තන්ගේ කාමර ගර්භ 456 ක්</u> සඳහා ඉඩකඩ සැළසූ එකී ගෘහ නිර්මාණ

සැළසුම් මතය. එකී පූර්වානුමාන ප්‍රකාශය 1983 මාර්තු මස 31 වැනි දින දරණ හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ ලිපියෙන් සඳහන් කර ස්ථිර කරඇත. 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වන මිට්සුයි/තායිසෙයි සංවිධානය වෙත 1983 මාර්තු මස 30 වැනි දින ඉදිකිරීම සඳහා ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර ඇත.

(ඈ) මෙහි ඉහත (ආ) උප ඡේදයේ සඳහන් කරණ ලද මුල් ගෘහ නිර්මාණ සැළසුම් පරික්ෂාකර සසඳා බලන ලෙසට සහ 1985 ඉදිරිපත්කොට 1986 අප්‍රේල් මාසයේ දී අනුමත කරන ලද අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලය සමඟ සසඳන ලෙසටත් පැමිණිලිකරු විසින් එකී ෂෙල්ටන් විජේරත්න මහතාගේ ඉල්ලා ඇත.

32. මේ සම්බන්ධයෙන් ෂෙල්ටන් විජේරත්න මහතා විසින් පැමිණිලිකරු අමතා 1990 අගෝස්තු මස 22 වැනි දින දරණ වාර්තාවක් නිකුත් කරන ලදි. එකී වාර්තාවෙන් පෙන්නුම් කරන ලද ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

(i) ඉහත කී මුල් ගෘහ නිර්මාණ සැළසුම අනුව ගොඩනැගිල්ලෙහි උස අඩි 274.6 ක් වියයුතු අතර, අවසරනොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම අනුව ගොඩනැගිල්ලෙහි උස අඩි 233.9 කී.

(ii) මුල් ගෘහ නිර්මාණ සැළසුම අනුව මැදි මහළ සහ බිම් මහළ ද ඇතුළුව මහල් සංඛ්‍යාව 23 ක්වූ අතර, අවසර නොලත් අනුමත ගෘහ නිර්මාණ සැළසුමෙහි ඇත්තේ, බිම් මහළ ද ඇතුළුව මහල් 20 ක් පමණක් වන අතර, ප්‍රධාන ගොඩනැගිල්ලේ මැදි මහළක් ද නොමැත.

(iii) ඉහත කී මුල් ගෘහ නිර්මාණ සැළසුමෙහි අමුත්තන්ගේ කාමර මහල් 19 ක් සපයා තිබුණු අතර, ඉහත කී අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම මඟින් සපයා ඇත්තේ අමුත්තන්ගේ කාමර මහල් 17 ක් පමණී.

(iv) ඉහත කී මුල් ගෘහ නිර්මාණ සැළසුමෙහි අමුත්තන්ගේ කාමර ගර්භ 456 ක් සපයා තිබුණු අතර, ඉහත කී අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම අනුව අමුත්තන්ගේ කාමර ගර්භ 408 ක් සහ ඊට අමතරව කලින් ප්‍රවේශ ශාලා ප්‍රදේශයේ දක්වන ලද අමුත්තන්ගේ කාමර ගර්භ 17 ක් සඳහා ඉඩකඩ සලසා ඇත.

(v) පාසන් පාර දත්තයක් වශයෙන් ගෙන, පතුල් මාල මට්ටම පොළවේ මට්ටමට අඩි 30.5 යටට යෑමට ඉඩකඩ සලසා තිබූ අතරම, අවසර නොලත් සංශෝධිත ගෘහ

නිර්මාණ සැළසුම්වල <u>පතුල් මාලයක් නැති</u> අතර, බිම් මහල පාසන්ස් පාර දත්තයක් වශයෙන් ගෙන බිම් මට්ටමට අඩි 4.1 දක්වා සමහර අංශවලදී කොටසක් ගිලීගොස් ඇති බව කියනු ලැබේ.

ප්‍රකාශ පත්‍රයෙහි වාර්තා කර ඇති පරිදි වාහන 400 ක් සඳහා වන මෝටර් රථ වාහන සංවෘත නැවතුම් පෙදෙසේ තිබිය යුතු වන්නේ පතුල් මහල ප්‍රදේශයේ විනා බිම් මහල් ප්‍රදේශයේ හෝ ඉහළ බිම් මහළ ප්‍රදේශයේ නොවිය යුතු බවත්, ඒවා මෙම ප්‍රදේශ එකී කොළඹ කොටුව ප්‍රදේශයේ ඉතා වටිනාකමක් ඇති බවත් අධික ආදායම් උපදවන සහ ලාභදායක වාණිජමය භාවිතය සඳහා උපයෝගී කරගත හැකි බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

(vi) එකී මුල් ගෘහ නිර්මාණ සැළසුමේ ඉඩකඩ සලසා තිබූ පතුල් මාලය වෙනුවට අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම්වල පතුල් මාලය නොමැති වීම නිසා <u>අත්තිවාරම් දෙක ද වෙනස් විය හැකි බවට ද</u> ෂෙල්ටන් විජයරත්න මහතාගේ වාර්තාවේ පෙන්නුම්කර ඇත.

(vii) පෙනී යන ලෙසට මෙහි පහත සඳහන් කරන 1985 අගෝස්තු මාසයේ දී ගොනු කර ඉදිරිපත් කර තිබූ එකී අවසරය ලබා නොගත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් සම්බන්ධව සඳහන් කරමින් 3 වැනි ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් පිළියෙළ කරන ලද 1985 ජුලි 15 දිනැති සංශෝධන පිළිබඳ උපලේඛණයකුත් එකී ෂෙල්ටන් විජේරත්න මහතා පරික්ෂා කර තිබූ අතර, <u>ඔහු විසින් පරික්ෂා කරන ලද ගෘහ නිර්මාණ සැළසුම් කට්ටල දෙක අතර ඇති වෙනස්කම් බොහොදුරට එකී උපලේඛණයේ තිබෙන</u> සංශෝධනවල දක්වා ඇති පරිදි වන බව එකී ෂෙල්ටන් විජේරත්න මහතා විසින් තම මතය ප්‍රකාශ කර ඇත.

වරලත් ගෘහ නිර්මාණ ශිල්පි ෂෙල්ටන් විජේරත්න මහතා විසින් පිළියෙල කරන ලද වාර්තාවේ සත්‍ය පිටපතක් **පී32ඒ** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, 1985.07.15 දිනැති 3 වැනි වින්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගමේ එකී උපලේඛණ **පී32බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙම ලියවිලි දෙකම මෙම පැමිණිලිපතට අමුණා ඇති අතර මෙහි කොටස් වශයෙන් සැළකර සිටියි.

තවද නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත කිරීමේ මුද්‍රාව දරණ 1986.04.29 දිනැති අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම්වල සත්‍ය පිටපතක් **පී54** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

33. (අ) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි විසින් 1987.04.30 දින දරණ වැඩ අවසන් සහතිකය නිකුත්කර ඇති බවත් 1988.05.25 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි විසින් 1988 මාර්තු මස 24 හා 25 වැනි දින අවසන් පරීක්ෂණය පැවැත්වූ බව ස්ථිර කරන ලද බවත් පැමිණිලිකරු පෙන්නුම් කර සිටියි.

(ආ) කෙසේවෙතත පැහැදිලිව පෙනෙන ලෙස 1988.08.25 වැනි දින යොදා ඇති 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ අවසාන සහතිකය, පැමිණිලිකරුගේ ඉල්ලීම මත, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ සභාගත කර ඇත්තේ 1988.10.04 වැනි දින පවත්වන ලද එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් **පී33** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඇ) 1988 මාර්තු 24 සහ 25 වැනි දින අවසාන පරීක්ෂණ පැවැත්වූයේ යයි කියනු ලබන නමුත් අවසාන සහතිකය නිකුත් කර ඇත්තේ ස්වාධීන ඉංජිනේරුවරයෙකුගේ සේවා ලබා නොගැනිමට තීරණයට එළඹි 1988.08.12 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පසුව පමණක් බවත් පැමිණිලිකරු පෙන්නුම් කර සිටියි.

(ඈ) 1988.08.25 දිනැති අවසාන සහතිකය නිකුත් කිරීමට පෙර 1988 මුලදී ඒ කාල වේලාවේ දී ස්වාධීන ඉංජිනේරුවරයෙකු පත් නොකිරීමට කරන ලද තීරණය වැරදි බව දැන් පෙන්වා දෙන අතර, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම සහ එහි කොටස්කරුවන් අයිතිවාසිකම්වලට එය හානිකර බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියි. 1988 මුල් කාලයේ දී තරයේ ඉල්ලා සිටින ලද පරිදි ස්වාධීන ඉංජිනේරුවරයෙකු පත් කරන ලද්දේ නම්, මෙහි පහත දක්වන්නාවූ පරිදි බොහෝ වෙහෙස මහන්සිවීම් සහ උත්සාහ ඇතිව දැනට සොයාගෙන ඇති නියම තත්ත්වය සොයා දැන ගැනිමෙන් හා සොයා ගැනිමෙන් 4 වනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම වැළැක්වීමට ඉඩ නොතිබුණු බව පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටි. තවද, මෙහි මින්මතු සඳහන් කරණ කරුණු තිබෙන හැටියට, ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 2.0 ක් (රුපියල් දශලක්ෂ 80 ක්) 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට ගෙවීම සිදු නොවීමට ඉඩ තිබුණි.

34. (අ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් සමඟ මුදල් ගැලීම පිළිබඳ නැවත ලේඛණගත කිරිම සඳහා වූ සාකච්ඡා සහ අදහස් හුවමාරුකර ගැනිමේ එකම ප්‍රතිඵලය වූයේ, ගෙවීමට යෙදී ඇති නැවත ගෙවීම් නියම කළ දිනකට, 1990 මාර්තු 11 දිනට කල් දැමීමය.

(ආ) අමුත්තන්ගේ කාමර ගර්භ ප්‍රයෝජනයට ගැනීමේ ඌනතාවය, ඒ මඟින් ලාභ උපදවන පූර්වානුමාන ප්‍රකාශයයන් හා මුදල් ගලනය හා එහි ප්‍රතිඵල වශයෙන් ණය ගෙවීමේ හැකියාවට ඇති බලපෑම පෙන්වා දෙමින් එකී නියම කළ දිනයේ දී එවැනි ගෙවීම් කිරීමට 4 වැනි විත්තිකාර සමාගමට අපහසු හා ප්‍රායෝගික නොවන බවත්, එකී දිනයට පෙර එකී ණය මුදල් පිළිබඳව දීර්ඝකාලීන නැවත ලේඛණගත කිරීමක් එකඟ විය යුතුව තිබෙන්නේ යැයි පැමිණිලිකරු අවධාරණයෙන් ප්‍රකාශ කර සිටියේ ය.

35. (අ) එකී 1990.03.11 වැනි දිනට අතරතුර ගෙවීම් කල් දැමීම සඳහා වූ අතුරු පිළියෙල කිරීම් වලට අනුකූලව, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය විසින්, එකී <u>හිල්ටන් හෝටල දේපල 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට උගස් කිරීමට බැඳීමක් අවශ්‍ය කරන කොන්දේසියක් සහිතව</u> ණය නැවත ලේඛණගත කිරීමේ කෙටුම්පතක් ඉදිරිපත් කරන ලද අතර එය 1989.07.12 වැනි දින හෝ ඊට ආසන්න දිනයක පවත්වන ලද 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සහගත කරන ලදී.

(ආ) පැමිණිලිකරු සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට, ශ්‍රී ලංකා ජනරජයේ එවකට පත්කර සිටි අධ්‍යක්ෂ ඒ.සී.රන්දෙනි මහතා විසින් විරෝධතා මතු කිරීම මත, <u>උගස් කිරීමේ අවශ්‍යතාවය නියම කරන්නා වූ</u> වගන්තිය <u>ප්‍රත්‍යක්ෂ අස්කිරීම</u> සහිතව එකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත.

(ඇ) එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට <u>රාජ්‍ය ඇපවීම සහ උගස්කරය යන දෙකම</u> ලබාගත නොහැකි බව පැමිණිලිකරු සහ ආචාර්ය ඒ.සී.රන්දෙනි මහතා විසින් තරයේ කියා සිටින ලදී.

(ඈ) කෙසේ වෙතත් එකී ගිවිසුම් <u>පසුව එකී උගස්කර වගන්තිය ද ඇතුළත්ව</u> 1989.07.17, 1989.07.18 සහ 1989.07.19 වැනි දිනවල හෝ ඊට ආසන්න දිනවල, <u>කූට ලෙසින් ලියා අත්සන් කර ඇති අතර</u>, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ, 1989.11.06 වැනි දින පත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, එකී අත්සන් කරන ලද ගිවිසුම් සහාගත කරන ලෙස පැමිණිලිකරු විසින් නැවත නැවත බලකර ඉල්ලීම් කළ විටදී පමණක් මෙය අනාවරණය විය.

(ඉ) තවද, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම අමතන ලද 1989.11.20 වැනි දින දරණ ඔහුගේ ලිපියෙන්, එකී ණය නැවත ලේඛණගත කිරීමේ ගිවිසුම් වලින් උකස්කර වගන්තිය අස් කිරීමට වහාම පියවර ගන්නා ලෙස නියම කරන ලදී. **පී34(ඒ)** යනුවෙන් සලකුණු

කර ඇති මෙකී ණය නැවත ලේඛණගත කිරීමේ ගිවිසුමෙහි **පී34(බී)** යනුවෙන් සලකුණු කර ඇති 1989.11.06 වැනි දින දරණ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව සහ **පී34(සී)** යනුවෙන් සළකුණු කර ඇති මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ එකී ලිපියෙහි සත්‍ය පිටපත් මෙම පැමිණිලි පතට අමුණා ඇති මෙහිම කොටසක් වශයෙන් සැළකර සිටී.

(ඊ) කෙසේ වෙතත් එකී උකස්කර වගන්තිය අස්කර දමා ඇත්තේ පැමිණිලිකරුගේ නැවත නැවත බලකර ඉල්ලීම මත 1990.05.17 දින පමණි.

එකී සංශෝධනයේ සත්‍ය පිටපතක් **පී35** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

36. (අ) මෙහි ඉහත සඳහන් කළ උකස් වගන්තිය සම්බන්ධවන කූට ඇතුළත් කිරීම පිළිබඳ එකී සිද්ධිය, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ නිළධාරීන්ගේ ඍජුභාවය, අවංකභාවය සහ චේතනාවන් පිළිබඳව පැමිණිලිකරුගේ සිතෙහි බරපතල සැකයක් ඇති කරන ලදි.

(ආ) ඒ අනුව, විධායක අධ්‍යක්ෂවරයෙකු නොවුනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පමණක් වන පැමිණිලිකරු විසින් 1989 නොවැම්බර් මස සිට, අදාළ සියලුම කරුණු ගැන සොයා බැලීමට තීරණය කරන ලදී.

37. ඊට පසුවම වාගේ පැමිණිලිකරු විසින් එකී විධායක අධ්‍යක්ෂ එච්.ඔගාමි මහතා සමග ලිපි හුවමාරු කර ගැනීම මගින්, මෙහි ඉහත සඳහන් කරන ලද, 1984.01.31 අත්සන් කරන ලද එකී මුල් ගිවිසුම් වලට අමතරව එකී අභ්‍යන්තර සැළසුම් වැඩ සඳහා ගිවිසුමක් සහ සම්ප්‍රේෂණයන් සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් හැර වෙනත් සංශෝධන හෝ ගිවිසුම් කිසිවක් නොමැති බවට තහවුරු කිරීමක් ලබා ගන්නා ලදී.

1989.11.27, 1989.11.29, 1989.12.08 සහ 1989.12.08 දිනැති එකී ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී36(ඒ), පී36(බී), පී36(සී) සහ පී36(ඩී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

38. (අ) 1989.11.20 දින හෝ ඊට ආසන්නයේ දී පමණ පැවැත්වූ 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මුදල් ගෙවීම සඳහා 1 වැනි සහ 2 වැනි විත්තිකාර ඉහත නම සඳහන් මිට්සූයි/තායිසෙ සංවිධානය බලකර සිටි විට, පැමිණිලිකරුගේ සැකයක් ඒ වන විටත් පැන නැග තිබූ නිසා සහ පැමිණිලිකරු වැඩ අවසන් සහතිකය, අවසාන වැඩ මැනීම ඇතුලු පරිමාණ පත්‍රය ඉල්ලා සිටි අතර, වැඩ අවසන් සහතිකය හැරුණු විට පරිමාන

පත්‍රයසහ අවසාන වැඩ මැනීම ආදී වෙන කිසිවක් නැති බව දැන ගන්නට ලැබීමෙන් පැමිණිලිකරු මවිතයට පත්විය. 1989.11.20 දින එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවි සත්‍ය පිටපතක් **පී37** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ආ) පැමිණිලිකරුට වැඩ අවසන් සහතික පත්‍රය ලැබී ඇත්තේ 1989 නොවැම්බර් මාසයේදී පමණක් වන අතර, වෙනත් ලිපි ලේඛණ නොමැතිවිම හේතුකොටගෙන මෙම සහතික පත්‍ර දෙකම - එනම් වැඩ අවසන් සහතික පත්‍රය සහ අවසාන සහතික පත්‍රය, අසතුටුදායක සහ පිළිගත නොහැකි හුදෙක්ම ලිපි පමණක් බවත්, ඒවා අවසාන සහතිකය නිකුත් කිරිමට පෙර අවසන් වැඩ මැනීම සහ නිවැරදි කිරිම් සහ සකස්කරගත යුතු දෝෂ දක්වන සහතික කල් නියම කළ පරිමාණ පත්‍රවල ඇතුළත් වන ඉදිකිරිම් කර්මාන්තයේ පිළිගත් හා අනුමාන කළ වැඩ අවසන් සහතික පත්‍රයේ ආකෘතියට කිසිදු ආකාරයකින් අනුකූල නොවූ බව පැමිණිලිකරුට එවිට අවබෝධ විය.

(ඇ) මෙවැනි ප්‍රධාන ජාත්‍යන්තර ඉදිකිරිම් සමාගම් මෙවැනි විශාල ප්‍රමාණයේ ව්‍යාපෘතියක් සඳහා අදාළ නියමාවලියක් ඇතුළුව අවසාන පරිමාණ පත්‍ර සහ වැඩ මැනිම් පිළියෙළ කර නැති බව පිළිගැනිමට ඔහුට නොහැකි බව සහ ඉදිකිරිම් කර්මාන්තයේ සාමාන්‍ය සිරිත සහ භාවිතය පරිදි එවැනි පරිමාණ පත්‍ර සහ වැඩ මැනීම් නැතිවිට හුදෙක්ම දෘෂ්ටික සහ සිතා ගැනීම් පදනමක් මත එකී පරික්ෂණය පැවැත්වූවා ද යන්න පැමිණිලිකරුට පෙනී ගියේ ය.

39. 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාගත කළ සහ සියලු අධ්‍යක්ෂවරුන් වෙත බෙදාහරින ලද 1989.11.27 සහ 1989.12.13 දිනැති සංදේශ මඟින්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට කවර ගෙවීමක්වත් කිරිම නුවණටහුරු නැති බව පැමිණිලිකරු ප්‍රකාශ කළ අතර, ඒකාන්ත නියමයෙන් සතුටුදායක පැහැදිලි කිරිමක් පැමිණිලිකරුට ලැබෙනතාක් කල්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය විසින් ඉල්ලා සිටි පරිදි රැඳවුම් මුදල් සහ/හෝ ඉතිරි ඉදිකිරිම් මුදල් වෙනුවෙන් 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම වෙනුවෙන් ඔවුන්ට යම් මුදලක් ගෙවීමට ඔහුට එකඟවීමට නොහැකි බව තවදුරටත් ප්‍රකාශ කරමින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට කවර කොටස් මුදලක්වත් ගෙවීමට කවර මුදලක්වත් යොදවනාවට වඩා පොදු කොටස් හිමිකරුවන් ඔවුන්ගේ කොටස් මූලධනයට ආපසු දිය යුතු බවට පැමිණිලිකරු යෝජනා කළේ ය.

1989.11.27 සහ 1989.12.13 දිනැති පැමිණිලිකරු සංදේශ හා 1989.11.21 හා 1989.12.13 දිනවල පත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තාවල සත්‍ය පිටපත් **පී38(ඒ),**

**පී38(බී), පී38(සී) සහ පී38(ඩී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

40. (අ) 1990.01.26 වැනි දින හෝ ඊට ආසන්න දිනයක එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමෙහි සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්.පෙරේරා මහතා සහ 4 වනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ කේ.එන්.චොක්සි මහතා සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත, විධායක අධ්‍යක්ෂ එච්.ඔගාමි මහතා ජපානයේ සිට පැමිණි මිට්සුයි/තායිසෙ සංවිධානයේ නිළධාරීන් ද ඇතුලු පිරිස එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය විසින් ඉදිරිපත් කරනු ලබන මුදල් ඉල්ලා සිටීම් පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව දැනුම, අනුමැතිය සහ කැමැත්ත නොමැතිව එකී රැස්වීම පවත්වා ඇත.

(ආ) එකී රැස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්.පාස්කරලිංගම් මහතා එම සාකච්ඡා ස්ථිර කරමින්, 1990.03.11 දින ගෙවීමට යෙදී තිබෙන නැවත උපලේඛණගතකල/කල් දැමූ ගෙවීම්, ගෙවීමට නියමිත දිනට පෙර, සාකච්ඡා සඳහා පදනමක් වශයෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට (ශ්‍රී ලංකා රුපියල් දශලක්ෂ අසූවකට සමාන) ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ දෙකක්වන සංකේත ගෙවීමක් කළයුතු බවට එම සාකච්ඡාවේ දී යෝජනා කර තිබුණු බව දන්වා තිබුණි.

(ඇ) එකී ඇමෙරිකන් ඩොලර් දශලක්ෂ 2.0 ක මුදලක් (ශ්‍රී ලංකා මුදලින් රුපියල් දශලක්ෂ 80.0 ට සමාන මුදලක්) 1990.03.08 වැනි දින හෝ ඊට ආසන්න දිනයක 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට ගෙවා තිබුණි. 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය ගිවිසුම පිළිබඳව ඉහත බරපතල කඩ කිරීමක් සිදුකර තිබූ බවත් සහ ඔවුන්ට මොන මොන කවර මුදලක්වත් ලබාගැනිමට හිමිකමක් නොතිබූ බවත්, එහෙත් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට පාඩු වෙනුවෙන් වන්දි ගෙවීමට සහ අත්තිකාරම් පිට දැනටමත් ලබාගෙන ඇති මුදල් නැවත ගෙවීමට වගකිව යුතු බව පසුව හෙළිවී ඇති පරිදි කරන ලද වැඩ කොටස පරීක්ෂා කිරීමට ස්වාධීන ගෘහ නිර්මාණ ශිල්පියෙකු/ඉංජිනේරුවෙකු පත්කළේ නම් එම ගෙවීම නොකිරීමට ඉඩ තිබුණි.

(ඈ) 1990.02.28 වැනි දින හෝ ඊට ආසන්න දිනයක පවත්වන ලද 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය සමඟ සම්පූර්ණ එකඟත්වයකට එළඹී අවසාන ලේඛණගත කිරීමේ සම්න්ධය මත පමණක් ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 2.0 ක ගෙවීම කළයුතු බව නැවත නැවතත් ප්‍රකාශ කරමින්, 1990.02.16 වැනි දින පවත්වනලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව, පැමිණිලිකරු විසින් නිවැරදි කරන ලදී.

(ඉ) කෙසේ වෙතත් පැමිණිලිකරු විසින් සැළකරන ලද විරෝධතා සහ මුදල් අමාත්‍යාංශය විසින් කරන ලද නියමයන් තිබියදීත්, <u>එකී රාජ්‍ය ඇපකර මඟින් ආවරණය නොවූ</u> ලැබිය යුතු ඉතිරි ඉදිකිරීම් ගෙවීම් සහ ඒ මත පොළිය වෙනුවට නතුකර ගනු ලැබ ඇත. 1990.02.08, 1990.02.16 සහ 1990.02.28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට සහ ටෝකියෝ නුවර ෆුජි බෑන්ක් බැංකුව වෙත යැවූ 1990.03.08 සහ 1990.03.08 දිනැති ලිපි, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය 4 වැනි විත්තිකාර සමාගමේ විගණකවරුන් වෙත යැවූ 1990.07.04 දිනැති ටෙලෙක්ස් පණිවුඩය සහ ලියවිලිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී39(ඒ), පී39(බී), පී39(සී), පී39(ඩී), පී39(ඊ) සහ පී39(එෆ්)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඊ) තවද, ඊට පෙර ආසන්නයේදීම පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරු විසින් නගන ලද විරුද්ධතාවයන් සහ කරුණු සැලකිරීම් සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 1989.11.27 සහ 1989.12.13 දින දරණ සංදේශ ද නොතකා එවැනි ගෙවීම් කිරීම සඳහා වන යෝජනාව කර ඇත.

(උ) මෙහි සඳහන් කර ඇති පරිදි ඊට පෙර ආසන්නයේදීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද විරුද්ධතාවයන් සහ නිරීක්ෂණ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත සම්පූර්ණ කරුණු පැහැදිලි කර දී නොමැති බව පැමිණිලිකරු සාධාරණ ලෙස විශ්වාස කර සිටියි.

41. (අ) විශේෂයෙන්ම ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන්, එනම් 3 වැනි විත්තිකාර සමාගමෙන් සතුටුදායක පැහැදිලි කිරීම්, ස්ථිර කිරීම් සහ නිසි ලෙස ලේඛණගත කළ සහතික කිරීම් ලැබෙන තාක් කල් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට කවර මුදලක්වත් ගෙවීමට පැමිණිලිකරු විරුද්ධ වී තිබූ, <u>පැමිණිලිකරුගේ 1989.12.13 දිනැති සංදේශය සම්බන්ධව</u> 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ කේ.එන්.චොක්සි මහතා විසින්

එච්.ඔගාමි අමතා <u>1990.02.28 දින දරණ</u> ලිපියක් 1990.02.28 වන <u>එදිනම පැවැත්වූ</u> අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී විධායක අධ්‍යක්ෂ, එකී එච්.ඔගාමි විසින්ම ඉදිරිපත් කරන ලදී. සම්ප්‍රදායික භාවිතය අනුව සියලු අවසාන විශේෂයෙන් නියම කළ පරිමාණ පත්‍ර සහ වැඩ මැනීම් සමග සවිස්තර ආකාරයෙන් ලේඛණගත කළ වැඩ අවසන් සහතිකයක් නැතිවීම නිසා මුදල් නොගෙවීම සම්බන්ධ මෙම තත්වය පැමිණිලිකරු විසින් ගන්නා ලදි. ස්වාධීන ඉංජිනේරුවරයෙකු විසින් පරීක්ෂණයක් කරනු ලැබීම සහ ඔහු විසින් වාර්තාවක් ඉදිරිපත් කිරිම සඳහා වන 1986 වර්ෂයේ මුලදී කර තිබූ යෝජනාවට ද පැමිණිලිකරු අවධානය යොමු කළේ ය.

කේ.එන්.චොක්සි මහතාගේ 1990.02.28 දිනැති ලිපියෙහි සත්‍ය පිටපතක් **පී40** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ආ) 1989.12.13 වැනි දින දරණ පැමිණිලිකරුගේ එකී සංදේශයේ වෙනත් දේ අතර පහත සඳහන් පරිදි ද ප්‍රකාශ කර ඇත.

''විශේෂයෙන්ම නියම කර ඇති සංඛ්‍යාවන්ට/ප්‍රමාණයන්ට අදාළ වන පරිදි, මා විසින් ඉහත දක්වා ඇති නියමයන්ට අනුකූලව හෝටල් ඉදිකිරීම් කරගෙන යනු ලබන්නේ දැයි අමුණා ඇති වැඩ අවසන් සහතික පත්‍රයේ පිටපතින් මට සෑහීමට පත්විය නොහැක. සම්ප්‍රදායික භාවිතයට අනුකූලව සියලුම පරිමාණයන් සහ වැඩ මැනීම් සහිතව සවිස්තරාකාරයෙන් යුත් වැඩ අවසාන සහතික පත්‍රයක් සාමාන්‍යයෙන් කෙනෙකුට බලාපොරොත්තු වන්නට ඉඩ තිබුණි. මේ සම්බන්ධයෙන් නිර්මාණ ශිල්පීන්ගෙන් සතුටුදායක පැහැදිලි කිරීම් සහ ස්ථිර කිරීම් ලබාගැනීමට කැමැත්තෙමි. එකාන්ත නියමයන් මත එවැනි සතුටුදායක පැහැදිලි කිරීම් සහ ස්ථිර කිරීම් මට ලැබෙනතුරු ගෙවිය යුතු ඉතිරි ඉදිකිරීම් සහ/හෝ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් ඉදිකිරීම් සංවිධානයට කිසිදු ගෙවීමක් කිරීමට එකඟවීමට නොහැකිවීම ගැන කණගාටු වෙමි. තවද, මේ කරුණ සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩයේ අවධානය අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවන්ට එනම්, 88/9, 88/11, 88/12 සහ 88/13 දරණ රැස්වීම් වාර්තාවන් සහ කේ.එන්.චොක්සි මහතාගේ 1988 අගෝස්තු මස 08 වන දින දරණ ලිපිය සහ විශේෂයෙන් එවකට අධ්‍යක්ෂ මණ්ඩලයට රජයෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරයෙකු වූ එම්.ටී.එල්.ප්‍රනාන්දු මහතා විසින් 1988.05.25 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී කරන ලද යෝජනාවන්ට හා විවේචනයන්ට යොමු කරනු කැමැත්තෙමි.''

(ආ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත එච්.ඔගාමි ඇමතූ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ කේ.එන්.චොක්සි මහතාගේ 1990 පෙබරවාරි 28 දිනැති එකී ලිපිය, එකී එච්.ඔගාමි විසින් එකී කේ.එන්.චොක්සි මහතා අමතනු ලැබ තිබූ ලිපියට පිළිතුරු ලිපිය විය. එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සහගත කළ කේ.එන්.චොක්සි මහතාගේ එකී ලිපියේ වෙනත් දේ අතර, පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි;

'' (අධ්‍යක්ෂ) නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 1989.12.13 දිනැති සංදේශය සම්බන්ධයෙන් 1990 පෙබරවාරි මස 21 දිනැති මා ඇමතූ ඔබගේ ලිපිය මම සළකා බැලුවෙමි. මම කොන්ත්‍රාත්තුව පිළිබඳව පොදු කොන්දේසිවල 16 වැනි වගන්තිය යටතේ ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් නිකුත් කරන ලද 1987.04.10 දිනැති ප්‍රායෝගික වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකය සහ 1988.08.25 දිනැති වැඩ අවසන් සහතිකය (අවසාන සහතිකය) සළකා බැලුවෙමි. මෙම සහතික කොන්ත්‍රාත්තුව පිළිබඳ පොදු කොන්දේසි අනුව වෙයි. '(එක අංශයක් හැර) සාවi වැඩ කටයුතු සම්බන්ධ වගකීමේ කාලසීමාව තුළ දී සියලු සාවi වැඩකටයුතු සිදු කරනු ලැබ ඇත.' යනුවෙන් වැඩ අවසාන සහතිකය විශේෂයෙන් ප්‍රකාශ කර සිටි. සහතික දෙක හෝටලයේ ඉදිකිරීම් වැඩ කටයුතු කොන්ත්‍රාත්තුවේ සියලු නියමයන්ට අනුකූල වන බවට සෑහෙන ආවරණ වන අතර, මෙම සහතික අනුව අයිතිකරු කොන්ත්‍රාත් වැඩවලට ඉතිරි මුදල් ගෙවීම සාධාරණ වන්නේ ය. තෙවැනි පාර්ශව ගෘහ නිර්මාණ ශිල්පියෙකුගෙන් වැඩ අවසාන සහතිකයක් ලබාගැනීම සම්බන්ධ අවශ්‍යතාවය/නුවණට හුරුභාවය පිළිබඳව, මෙය අවශ්‍ය නැති ව මම 1988 අගෝස්තු මස 08 දිනැති ලිපියෙන් දැනටමත් උපදෙස් දී ඇත. කරුණාකර මෙම ලිපිය අද දින රැස්වීමේ දී සහාගත කරන්න.''

(ඇ) ඉහත කී ලිපියේ අඩංගු කරුණු සම්බන්ධව පැමිණිලිකරු විසින් ඔහුගේ විරුද්ධතාවයන් ප්‍රකාශ කළ විටදී, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය් නියෝජිත විධායක අධ්‍යක්ෂ එච්.ඔගාමි මහතා විසින් තමා වෙත ඉදිරිපත් කරන ලද කරුණු අනුව එකී ලිපිය තමා විසින් ලියන ලද බව සහ අවශ්‍ය වුවහොත්, තමාගේ මතය සංශෝධනය කිරීම සලකා බලන බවටත් සිය අදහස කේ.එන්.චොක්සි මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඉ) නිසි සහතික සහ ලියකියවිලි නොමැතිවිට සහ නියම කළ පරිමාන පත්‍ර සහ අවසාන වැඩ මිනුම් නොමැතිවීම නිසා එහි සහතිකවල අප්‍රමාණවත්භාවය, සහ කාමර සංඛ්‍යාවෙහි වෙනස, 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී සහාගත කර බෙදාහරින ලද 1989.11.27 සහ 1989.12.13 වැනි දින දරණ පැමිණිලිකරුගේ සංදේශයන් හි යොමු කර තිබුණි.

(ඊ) පැමිණිලිකරු තවදුරටත් සොයාබැලීම නොකඩවා කරගෙන ගිය අතර, මෙහි පහත දක්වන පරිදි වඩාත් විස්තර සහිතව කර ඇති පරිදි ඊට ටික දවසකට පසුව, මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන්ට සහායවීම පිළිබඳ කටයුතු කරගෙන යෑමේ දී පැමිණිලිකරුගේ ඉල්ලීම පිට මුදල් අමාත්‍යාංශය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් ගෘහ නිර්මාණ ශිල්ප සැලසුම් කට්ටලයක් ඉල්ලා සිටි විට, එකී ආයෝජන ගිවිසුමේ විධිවිධානවලට පටහැනිව සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නැතිව, <u>අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක්</u> ඉදිරිපත් කර තිබූ බව පැමිණිලිකරු සොයාගත්තේ ය. 1990 මාර්තු 07 දින පැවැත්වූ ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පැමිණිලිකරු විසින් මෙම ඉතා බරපතල කාරණය 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වන ලදී. 1990.03.07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ සත්‍ය පිටපතක් **පී41** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

42. (අ) 1990 පෙබරවාරි මස මුදල් අමාත්‍යාංශයේ පවත්වන ලද රැස්වීමකදී, එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ නියෝජිතවරුන් සමඟ සාකච්ඡා කිරීම සහ සාකච්ඡා කර නියම කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අතිරේක නියෝජ්‍ය ලේකම් කේ.ෂන්මුගලිංගම් මහතාට සහ ආර්ථික කටයුතු පිළිබඳ වී.එච්.වයි.කාසිචෙට්ටි මහත්මියට සහාය වන ලෙස, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්.පාස්තරලිංගම් මහතා විසින් පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටින ලදී.

(ආ) පැමිණිලිකරු එහි ප්‍රතිඵල වශයෙන් එකී සාකච්ඡාවලදී එකී නිළධාරීන්ට සහාය වීමට නෙයෙක් ලිපි, උපලේඛණ සහ ගණන් බැලීම් ඉදිරිපත් කළ අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ නියෝජිතයින් සමඟ රැස්වීම් ගණනාවකට සහභාගි විය.

(ඇ) මෙම රැස්වීම්වලදී, කාමර ගර්භ සංඛ්‍යාව සහ ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශය සහ මුදල් ගලන ප්‍රක්ෂේපණයන් පිළිබඳ එහි බලපෑම ප්‍රශ්නය නැවත වරක් පැමිණිලිකරු විසින් මතු කරන ලද අතර, අමුත්තන්ගේ කාමර ගර්භ 387 ක පදනම මත නොව, අමුත්තන්ගේ කාමර 452 පදනම මත ගණන් බලන ලද එවැනි ලාභ උපදන පූර්වානුමාන ප්‍රකාශයන් සහ මුදල් ගලන ප්‍රක්ෂේපනයන් මත රාජ්‍ය ඇප නිකුත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

43. (අ) මුදල් අමාත්‍යාංශයේ සාකච්ඡාවලදී සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැමිණිලිකරු නැවත වරක් කාමර ගර්භ ගණන සම්බන්ධව ප්‍රශ්නය නැවත වරක් මතු කළේ ය. 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම විසින් පිළියෙළ කර

ඇති බවට අරමුණු කළ ගැලපූ උපලේඛණයක් සහතික කිරීමෙන් සිතාමතාම වැරදි කරුණු ඉදිරිපත් කරමින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත, විධායක අධ්‍යක්ෂ ඔගාමි අධ්‍යක්ෂ මණ්ඩලය නොමග යැවීමට නැවත උත්සහා කළේ ය.

(ආ) මෙම උපලේඛණයෙහි මුල් පිටපත, ඉල්ලුම් කර සිටිය නමුත්, ඔගාමි මහතා විසින් එය ඉදිරිපත් කිරීම මගහැරිය නමුත්, මෙම කරුණ ගැන තවදුරටත් කටයුතු කිරීමේදී, මෙම කරුණු ඉදිරිපත් කිරීමේ නිරවiතාවය ගැන සැකකළ පැමිණිලිකරුට, උපලේඛණයේ මුල් පිටපත ඇත්තවශයෙන්ම හිල්ටන් හෝටලයේ ඉදිරි පාර්ශවයේ කාර්යාල කළමණාකරුවකු විසින් අලෙවි කාර්යයන් සඳහා පිළියෙළ කරන ලද්දක් බවත්, එය ද එකී ඔගාමි මහතා විසින් තවදුරටත් වංචාවෙන් වෙනස් කරන ලද බවත් එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ සාමාන්‍යාධිකාරිවරයාගේ 1990.06.26 වැනි දින දරණ ලිපිය පරිදි, සොයා ගැනිමට හැකිවී ඇත.

එකී උපලේඛණය, **පී42(ඒ)** සහ 1990.06.29 වැනි දිනැති ලිපියේ සත්‍ය පිටපතක් **පී42(බී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

44. (අ) විෂයගත කරුණු තවදුරටත් සොයාබැලීමට පැමිණිලිකරු කමැති වූ හෙයින්, අනුමත කළ ගෘහ නිර්මාණ සැලසුම් කට්ටලයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගන්නා ලෙසට මුදල් අමාත්‍යාංශයේ දී ඔහු ඉල්ලා සිටියේ ය. මෙය මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරන ලද අතර, නාගරික සංවර්ධන අධිකාරියෙන් ගෙනෙන ලද එකී ගෘහ නිර්මාණ සැලසුම් කට්ටලය පැමිණිලිකරු පරික්ෂාවෙන් බැලූ විට, ඒවා 1986 අප්‍රේල් 29 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමැතිය දෙනු ලැබ තිබූ 1985 ජූලි 15 දිනැති ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් පිළියෙළ කරන ලද සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් බව දැනගත් විට, පැමිණිලිකරු කම්පාවට සහ පුදුමයට පත් විය. එකී ගෘහ නිර්මාණ සැළසුම් සමඟ මුදල් අමාත්‍යාංශයට රැගෙන පැමිණි නාගරික අධිකාරියේ ලිපිගොනුත් සමඟ තිබුණු ලිපිය අනුව, ප්‍රධාන ඉංජිනේරු වශයෙන් සී.වීරකෝන් යන අයෙකු විසින් අත්සන් කරන ලද 1985 අගෝස්තු මස 08 දිනැති ලිපියක් පරිදි එකී ගෘහ නිර්මාණ සැළසුම් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කරනු ලැබ තිබූ බව පැමිණිලිකරුට පෙනෙනන්ට තිබුණි.

(ආ) 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ප්‍රත්‍යක්ෂ අනුමැතිය නැතිව එවැනි සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් ඉදිරිපත් කිරිමට එකී සී.වීරකෝන්ට හෝ සීමාසහිත හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ

කවර වෙනත් නිලධාරියෙකුට හෝ මොන මොන කවර බලයක් හෝ අයිතිවාසිකමක් නොතිබුණු බවත්, තවද ආයෝජන ගිවිසුමේ 6.01 (iv) (එෆ්) වගන්තිය සහ 12.02 වගන්තිය අනුව, ශ්‍රී ලංකාවේ රජය ඇතුළුව එයට දායක සියලු පාර්ශවයන් අතර, එවැනි යම් සංශෝධනයන් ඇති කිරීමට ලිඛිතව ඇතුළත් විය යුතුව තිබූ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

(ඇ) එකී සංශෝධිත ගෘහ නිර්මාණ සැලැස්ම කට්ටලය සාක්ෂි දරණ පරිදි එය ඇත්ත වශයෙන් පිළියෙළ කරනු ලැබ ඇත්තේ, එකී තුන්වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පින් හෙයින් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ නියෝජිත එවකට විධායක අධ්‍යක්ෂ ඒ.නකා මහතා 4 වැනි විත්තිකාර සමාගමේ කොළඹ කාර්යාලයේ කාර්ය භාරව සිටි අතර, ඔහු ජපානයේ සිටින 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පින් සමඟ සියලු ලිපි ගනුදෙනු සඳහා වගකිවයුතු වූ හෙයින්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ නියෝජිත, එකී විධායක අධ්‍යක්ෂ ඒ.නකා මහතාගේ සම්පූර්ණ දැනුම සහ නියමය ඇතිව මෙම සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලය පිළියෙළ කර ලබාගෙන සහ නාගරික සංවර්ධන මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බව ඉතා පැහැදිලි වෙයි.

(ඈ) මෙම අවස්ථා දෙකෙහිදීම, සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් රැගෙන නාගරික සංවර්ධන අධිකාරියෙන් පැමිණි නිළධාරීතැන පවසා සිටියේ, නාගරික සංවර්ධන අධිකාරියේ <u>වෙනත් සැළසුම් කිසිවක් නොමති බවත්</u>, තමාට <u>නාගරික සංවර්ධන අධිකාරියෙහි මුල් ගෘහ නිර්මාණ සැලසුමේ පිටපතක් සොයා ගැනීමට නොහැකි වූ</u> බවත් ය.

(ඉ) කෙසේ වෙතත්, ඉන්පසුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුල් ගෘහ නිර්මාණ සැලසුම් කට්ටලයක් වශයෙන් අරමුණු කළ ගෘහ නිර්මාණ කට්ටලයක් 1990 මැයි මස 03 දින දරණ ලිපියෙන් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම මත පැමිණිලිකරු විසින් මෙම ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලය පරීක්ෂා කරනු ලැබූ විටදී, එකී පත්‍රිකා අනුමත සැළසුම් ලෙස හදුනා ගනිමින් කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය පිළිබඳව නිළ මුද්‍රාව මෙම ගෘහ නිර්මාණ කට්ටලයේ නොමැති බව පැමිණිලිකරු විසින් නිරීක්ෂණය කර ඇති අතර, 1984 ජනවාරි මස 19 වැනි දින දරණ නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිය පරිදි මුල් ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයට පත්‍රිකා 27 ක් අඩංගු වූ අතර, මෙම ගෘහ නිර්මාණ සැලසුම් කට්ටලයට තිබෙන්නේ පත්‍රිකා 21 ක් පමණක් බව පැමිණිලිකරු විසින් පත්‍රිකා ගණන් කර බැලීමේ දී නිරීක්ෂණය කරන ලදී. පැමිණිලිකරු විසින් මෙම වෙනස්කම් මුදල් අමාත්‍යාංශය වෙත පෙන්වා දෙන ලදී.

(ඊ) කෙසේ වෙතත්, ඉන්පසුව 4 වැනි විත්තිකාර සමාගමේ සාමාන්‍යාධිකාරි විසින් පැමිණිලිකරු අමතා එවන ලද 1990.07.05 දින දරණ ලිපියෙන් ස්ථිර කරන ලද පරිදි මුල් අනුමත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් තමන් වෙත නොමැති බවට 4 වැනි විත්තිකාර සමාගම වෙත 1990 ජුනි මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දෙන ලදී. කෙසේ වෙතත්, 1984 මාර්තු මස 23 දින දරණ නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිය මගින් එකී <u>මුල් ගෘහ නිර්මාණ සැළසුම්</u> අනුමත කිරීම <u>ස්ථිර කරන ලදී.</u> 1985.08.08 වැනි දිනැති සී.වීරකෝන් විසින් අත්සන් කරන ලද හා මින් ඉහත (ඇ) උපජේදයෙහි සඳහන් කරන ලද ලිපියේ සත්‍ය පිටපත සහ 1990.05.03 දින දරණ ලිපිය සහ 4 වැනි විත්තිකාර සමාගමේ 1990 ජුනි මස 05 දින දරණ ලිපියේ සත්‍ය පිටපත් පිළිවෙලින් **පී43(එ), පී43(බී) සහ පී43(සී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

45. (අ) පැමිණිලිකරු සහ එකී එච්.ඔගාමි විසින් හුවමාරුකර ගන්නා ලද 1990 අප්‍රේල් 12 සහ 1990 අප්‍රේල් 18 දිනැති ලිපි සම්බන්ධව පැමිණිලිකරු 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් මිට්සුයි/තායිසෙ සංවිධානයේ නියෝජිත විධායක අධ්‍යක්ෂ එච්.ඔගාමි අමතා 1990 අප්‍රේල් මස 24 දින ලිපිය ලිව්වේ ය. එම ලිපියේ වෙනත් දේ අතර, උකස් වගන්තිය සම්බන්ධව කූට ඇතුලත් කිරීම පිළිබඳ කරුණු පෙන්වා දෙමින්, සම්බන්ධකමක ඇති පාර්ශවයක් නියෝජනය කිරීමෙන් ප්‍රතිවිරුද්ධ අයිතිවාසිකම් තිබියදීත්, එකී ඔගාමි මහතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කල්පනාවට භාජනය කරනු ලබන කරුණුවලට සහ තීරණවලට බලපෑම් කිරීමට උත්සහා ගෙන ඇති බව පැමිණිලිකරු එකී ලිපියෙහි ප්‍රකාශ කළේ ය.

(ආ) <u>1984 මාර්තු මාසයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබ ඇති ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලයක් මත පදනම් වූ 1984 මාර්තු මාසයේ දී ඉදිකිරීම් වැඩ ආරම්භ කළ පසුව, සමාගමේ අනුමැතිය නොමැතිව 1985 අගෝස්තු මස ඉදිරිපත් කළ සංශෝධිත ගෘහ නිර්මාණ සැළැස්මකට සම්බන්ධ හෙයින්,</u> නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකය මෙන්ම, ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් නිකුත් කරන ලද අදාළ සහතිකවල අර්ථයක් හෝ වලංගු භාවයකින් හෝ නොමැති බව පැමිණිලිකරු එකී ලිපියෙහි තවදුරටත් කියා සිටි අතර, තවද, එම චිත්‍ර සැළසුම් සහ නියමාවලියන් 1984 ජනවාරි 31 දින, 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම ඇතුළත් වූ ඉදිකිරීමේ ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් යුත්ක වූ බවත් පෙන්වා දුන්නේ ය.

(ඇ) මින් ඉහත කලින් වූ (අ) සහ (ආ) ජේදයන් හි සඳහන් කරන ලද එකී ලිපියට පිළිතුරු පැමිණිලිකරුට අද වනතුරු ලැබී නැති අතර, මිට්සුයි/තායිසෙ සංවිධානය වරදක් කර ඇති බව සහ පැමිණිලිකරු විසින් නියම කොට ඉල්ලා සිටි

අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් විස්තර කිරීමට සහ සැපයීමට ඔවුනට, නොහැකි බවත් පමනක් එයින් හැඟී යයි.

(ඈ) 1990 අප්‍රේල් මස 12 දිනැති පැමිණිලිකරුගේ ලිපිය මඟින් අනුකූලතා සහතිකය ලබා ගැනිම සඳහා කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙන් පමණක් 1987.04.27 දිනැති අනුකූලතා සහතික පැමිණිලිකරුට ලැබුණි. <u>1986 අවුරුද්දේ අනුමත කරනු ලැබූ සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් පරිදි හිල්ටන් හෝටලය ඉදිකර ඇති බව පමණක් අනුකූලතා සහතිකයේ සහතික කර ඇත.</u> එකී සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් <u>අවසර නුදුන්</u> සැළසුම් කට්ටලයක් බවත්, 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය අතර ඇතුළත් වූ ඉදිකිරීම් ගිවිසුමේ අවශ්‍ය කොටසක් නොවන බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

1990.04.12, 1990.04.18 සහ 1990.04.24 දිනැති එකී ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී44(එ), පී44(බී) සහ පී44(සී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

46. (අ) 1990.03.07 වැනි දින හෝ ඊට ආසන්න දිනයක පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, පැමිණිලිකරු විසින් වහාම මෙම බරපතල කරුණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලද අතර, නිර්මාණ ශිල්පීන්ට එනම් 3 වැනි විත්තිකරුට තමා කෙලින්ම ලියන බවට පැමිණිලිකරු විසින් තරයේ ඉල්ලීම නිසා පැමිණිලිකරුට එසේ කළ හැකි බවට අධ්‍යක්ෂ එකඟ විය.

(ආ) මෙය ඉතා බරපතල කරුණක් ලෙස නිරීක්ෂණය කළ කේ.ෂන්මුගලිංගම් මහතා විසින් පැමිණිලිකරුට දේශීය ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ හෝ ඉංජිනේරුවරයෙකුගේ සහාය ලැබිය යුතු බවත් එකී මුල් ගෘහ නිර්මාණ සැළසුම් සහ පරිමාණ පත්‍ර පිටපත් ඉහත නම සඳහන් 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් ලබා ගන්නා ලෙසත් යෝජනා කරන ලදි.

(ඇ) දේශිය සහ නිර්මාණ ශිල්පියෙකුගේ හෝ ඉංජිනේරුවෙකුගේ සේවය ලබා ගැනීමට පැමිණිලිකරු විසින් ගන්නා ලද ස්ථාවරය සම්පූර්ණයෙන්ම නිදොස් බව ඔප්පු කරයි.

47. (අ) 1990.04.24 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පැමිණිලිකරු ප්‍රමුඛ කරුණු දක්වමින් මෙම බරපතල විෂයගත කරුණ මත සම දින දරණ සංදේශයක් ඉදිරිපත් කළ අතර, එහි වෙනත් දේ අතර, පහත සඳහන් කරුණු ද සැළකර සිටියේ ය,

(i) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ සමාගම විසින් දෙන ලද සහතික සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් දෙන ලද අනුකූලතා සහතිකය 1984 ජනවාරි මස 31 වැනි පැවැති විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් ලියා අත්සන් කරන ලද පී(8) දරණ ඉදිකිරීමේ ගිවිසුමට අමුණා ඇති සැළසුම් චිත්‍ර සහ නියමාලියන් ගැන සඳහන් නොවන වෙනත් සැළසුම් කට්ටලයක්, චිත්‍ර සහ නියමාවලියන් ගැන සඳහන් කරන අතර, එකී සැළැස්මවල්, චිත්‍ර නියමාවලියන්ට අනුකූලව 1983 මාර්තු මස 30 දින මිට්සුයි/තායිසෙ සංවිධානයට ප්‍රදානය කරනු ලැබ ඇති ඉදිකිරීම් සඳහා වන ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කරනු ලැබ ඇති අතර , තවද , එකී සැළසුම් චිත්‍ර සහ නියමාවලියන් එකී ඉදිකිරීමේ ගිවිසුමේ අවශ්‍ය කොටසක් වශයෙන් තිබුනේ ය.

(ii) ඒ අනුව නිකුත් කරන ලද සහතික වලින් සඳහන් කරනුයේ ලකුණු කරන ලද ඉදිකිරීම් ගිවිසුමෙහි කොටසක් නොවන්නාවූ වෙනත් සැළසුම් කට්ටලයක් චිත්‍ර සැළසුම් හා නියමාවලියන් නිසා ඉදිකිරීම් ගිවිසුම් සහතික නොකර පවතින බවට පැමිණිලිකරු විසින් කරුණු ඉදිරිපත් කර සිටි. එමනිසා නියම කරන ලද සහ අවශ්‍යකරන ලද සහතික කිරීම් නොමැති වීම නිසා කිසිදු ගෙවීමක් ලැබීමට නියමිතව නොමැත.

(iii) මෙය ඉතා බරපතල කරුණක් බවත්, දැඩි පරික්ෂාවක් සහ පැහැදිලිකිරීමක් අවශ්‍ය කරන්නක් බවත් <u>ඉහත සඳහන් කරුණු දැඩි ලෙස පරික්ෂා කොට විසඳාගන්නා තෙක් හෝ නොඑසේ නම් බේරුම් කිරීමකට යොමු කරන තෙක් මිට්සුයි/තායිසෙ සංවිධානයට වන සියලුම ගෙවීම් අත්හිටුවිය යුතු බවටත්</u> පැමිණිලිකරු විසින් තීරණය කරන ලදී. එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් කේ.ෂන්මුගලිංගම් මහතා පැමිණිලි කරමින් සඳහන් කරන ලද අදහස්වලට එකඟ වූ අතර, නිසි සහ සවිස්තර වාර්තාවක් ලබාගැනිම සඳහා දේශිය ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ සහ/හෝ ඉංජිනේරුවරයෙකුගේ සේවා ලබාදීමෙන් පැමිණිලිකරුට සහාය විය යුතු බවට වූ යෝජනාව නැවත නැවතත් සඳහන් කරන ලදී. 1990.04.24 දින දරණ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව සහ සම දින දරණ 1990.04.24 වැනි දින දරණ පැමිණිලිකරුගේ සංදේශයේ සත්‍ය පිටපතක් පිළිවෙලින් **පී45(ඒ) සහ පී45(බී)** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

48. (අ) අයෝජන ගිවිසුමට සියලුම පාර්ශවකරුවන් විසින් අත්සන් කරන ලද සංශෝධනයකින් 1990 අප්‍රේල් මස 30 දින එකී ආයෝජන ගිවිසුමේ 11.05 වගන්තිය නිෂ්ප්‍රභා කර බලරහිත කළ අතර, ඒ මගින් 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ කළමණාකරණ සහ පාලන කටයුතු කරමින් කොළඹ සිටින පූර්ණකාලීන විධායක අධ්‍යක්ෂකවරයෙකු තබාගැනීමට ඇති ඔවුන්ගේ අයිතිය 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය විසින් අත්හැර දමන ලදී. ඒ අනුව එච්.ඔගාමි 1990 අප්‍රේල් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වූ අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය නියෝජනය කරමින් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවට කේ.ඉතෝ පත් කරන ලදී.

(ආ) යම් සංශෝධනයන් පිළිබඳව එකී ආයෝජන ගිවිසුමේ (පී9) පහත සඳහන් විධිවිධාන ඇතුළත් වෙයි.

(i) 6 වැනි වගන්තිය - විශේෂ ප්‍රඥප්ති 6.01(iv)(එෆ්)

''පහත සඳහන් කරුණුවලට මෙහි පාර්ශවකරුවන්ගේ ලිඛිත කැමැත්ත දීමේ එකඟතාව මගින් ඒකමතික අනුමැතිය අවශ්‍ය වන අතර, පාර්ශවකරුවන් ක්‍රියාකළ යුත්තේ ය සහ /හෝ ඔවුන් ඒ අනුව සමාගමට කටයුතු කිරීමට සැළැස්විය යුත්තේ ය.

(එෆ්) යම් ගිවිසුමක් කවර හෝ සැළකිය යුතු ආකාරයකින් හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අවසන් කිරීම හෝ එහි බලය සමාගමේ මූල්‍ය තත්ත්වය, දේපළ සහ මෙහෙයුම් මත බරපතල පීඩාකරී බලයක් ඇති කරන්නේ ය.

(ii) 12.02 වගන්තිය :

මෙහි එක් එක් පාර්ශවකරුවන්ගේ නිසි බලය ලත් නියෝජිතයා විසින් ලිඛිතව ස්ථිර නොකරනු ලැබුවහොත් මෙම ගිවිසුමේ සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් හෝ මොන මොන කවර අරමුණක් සඳහාවත් බල නොපැවැත්විය යුත්තේ ය.

(ඇ) මින් ඉහත ජේදයේ සඳහන් කරන ලද පරිදි එකී අයෝජන ගිවිසුමෙන් දන්වා ඇති පරිදි එකී අයෝජන ගිවිසුමෙන් සහ ඇති පරිදි, ශ්‍රී ලංකා රජය ඇතුළත් වන්නා වූ එකී ආයෝජන ගිවිසුමට පර්ශවකරුවන් වූ සියල්ලන් විසින්ම ගෘහ නිර්මාණ සැළසුම් වෙනුවෙන් වූ එකී සංශෝධනයන් ද අත්සන් කළ යුතුව තිබුණි.

1990 අප්‍රේල් මස 30 වැනි දින දරණ එකී සංශෝධනයක සත්‍ය පිටපතක් **පී46** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

49. (අ) 1990 අප්‍රේල් 24 දිනැති එකී සංදේශය පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය මුදල් අමාත්‍යාංශය සමග කෙලින්ම සාකච්ඡා කිරීමට සහ සාකච්ඡා කර නියම කර ගැනීමට කැමති බව ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී කේ.ඉකෝ යෝජනා කළ අතර, එවැනි රැස්වීම් සඳහා කටයුතු පිළියෙළ කිරීමට කේ.ෂන්මුගලිංගම්ගෙන් ඉල්ලා සිටි අතර, එසේ කිරීමට ෂන්මුගලිංගම් කැමති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙහි ඉහත සඳහන් කර ඇති පැමිණිලිකරුගේ සහභාගීත්වයෙන් මුදල් අමාත්‍යාංශයේ දී ඇති වූ සාකච්ඡා සහ සාකච්ඡා කර නියම කර ගැනීම, අත්හැර දැමූ අතර පවත්වාගෙන නොගියේ ය.

(ආ) ඉන්පසුව එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය විසින් මුදල් ඉල්ලීම් බලකර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ඇප ලිපි අනුව කටයුතු කිරීමට ඔවුන් තර්ජනය කරමින් සහ මින් ඉහත සහ මෙහි පහත පසුව තවදුරටත් සඳහන් කරන පරිදි දැනට මතු වී ඇති බරපතල වෙනස්කම් පැහැදිලි කිරීම වැළැක්වීමට සහ සැඟවීමට තැත් කිරීම නිසාත් එකී 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය සමඟ සාකච්ඡාවක් සහ සාකච්ඡා කර නියම කර ගැනීම් පවත්වන ලෙස නිළධාරින්ගේ කමිටුවක් පත් කරන ලදී.

50. මෙම කරුණු තවදුරටත් සොයා බලා පරික්ෂා කිරීමට අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් ලබාගැනිමට පැමිණිලිකරු විසින් කරන ලද උත්සාහයන් මේ දක්වා අසාර්ථක බවට ඔප්පු විය.

(i) 4 වැනි විත්තිකාර සමාගමේ කාර්යාලයේ එකී මුල් අනුමත කළ ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් හෝ නියම කළ පරිමාණ පත්‍රය සහ වැඩ මැනීම පිළිබඳ ලියවිලි හෝ නොමැති බව 4 වැනි විත්තිකාර සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් ස්ථිර කරනු ලැබ ඇත.

(ii) 4 වැනි විත්තිකාර සමාගම් කළමණාකාර අධ්‍යක්ෂ ''නාසංඅ බලපත්‍ර සහ අනුමත කිරීම් එල්/ජේඑච්/එච්පී/1/4'' යන ශීර්ෂය යෙදූ අතින් ලියූ කෙටි සටහනකට අවධානය යොමු කළ අතර, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය විසින් ඉල්ලා ගන්නා ලද අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම් 1984

වැඩබිම් කාර්යාලයේ ඇතිවූ ගින්නේ දී දැවීගිය බවට අරමුණු කළ අත් අකුරින් ලියූ සටහනක් තිබුනේ ය.

අත් අකුරින් ලියූ එකී සටහනේ සත්‍ය පිටපත් **පී47** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(iii) මින් ඉහත සඳහන් කරන ලද පරිදි 24 ජේදයෙහි සඳහන් කරන ලද පරිදි ඇත්ත වශයෙන්ම එකී ගින්න සිදුවී ඇත්තේ 1985 ඔක්තෝබර් මාසයේ දී බවත්, පිළිගත් මුල් ගෘහ නිර්මාණ සැළසුම් යටපත් කිරිමේ අදහසින් කරන ලද බවට බොහෝදුරට පෙනී යන එකී සටහනෙහි වංචාකාරි ස්වරූපය ගැන සැළකිලිමත් වෙමින් පැමිණිලිකරු විසින් පෙන්නුම් කර සිටි. තවද, ඉදිකිරිම් කාර්යයන් සඳහා සැළසුම් සහ සැළසුම් චිත්‍ර ප්‍රමාණ යටත් වඩා වැඩි ප්‍රමාණයක් තමන් වෙත මෙන්ම, එකී ඉදිකිරිම් මෙහෙයවමින් සහ අධීක්ෂණය කරමින් එම කාලයේදී කොළඹ නගරයේ සිටි 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත ද තිබිය යුතුව තිබියදී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අනුමත මුල් ගෘහ නිර්මාණ සැළසුම් එකම කට්ටලය 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානය විසින් ඉල්ලා සිටිම ලොකු පුදුමයකි.

(iv) අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් නගර සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනිම පැමිණිලිකරු විසින් දරණ ලද උත්සාහයයන් ඉහත දක්වා ඇති පරිදි නිසි ප්‍රතිඵලයක් නොලැබුණු අතර, ඔවුන් වෙත එකී අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම් පිටපත් නොමැති බවට නගර සංවර්ධන අධිකාරිය අවසානයේ දී ස්ථිර කළේ ය.

(v) 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම ඇමතූ 1990.06.05 දිනැති ලිපිය පරිදි එම අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් සඳහා විශේෂිත ඉල්ලීමක් කර තිබුණත්, 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පී සමාගමෙන් එකී අනුමත කළ ගෘහ නිර්මාණ සැළසුම්වල පිටපතක් මේ දක්වා ලබාගැනිමට පැමිණිලිකරුට නොහැකි වී ඇත. පැමිණිලිකරුගේ එකී ලිපියෙන් පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින ලද එකී අනුමත කළ මුල් ගෘහ නිර්මාණ සැළසුම්වල කට්ටලයක් ඇත්ත වශයෙන්ම ප්‍රතික්ෂේප කරමින් 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගමෙන් 1990.06.20 දිනැති ලිපිය පිළිතුරු වශයෙන් පැමිණිලිකරුට ලැබුනේ ය. පැමිණිලිකරු 1990.08.30 දිනැති ලිපියෙන් පිළිතුරු යවා ඇත. පැමිණිලිකරු විසින් 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත ලියන ලද 1990.06.05 දිනැති එකී ලිපයේ සත්‍ය පිටපතක් 1990.08.30 දිනැති පැමිණිලිකරුට එවූ ඔවුන්ගේ ලිපියේ සහ පැමිණිලිකරු විසින් 3 වැනි විත්තිකාර

ගෘහ නිර්මාණ ශිල්පි සමාගම වෙත පැමිණිලිකරු විසින් යවන ලද 1990.08.30 දිනැති ලිපියේ සත්‍ය පිටපත් පිළිවෙලින් **පී48ඒ, පී48බී සහ පී48සී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(vi) 1983.03.30 වන දින 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමේ ලිපිය නිකුත් කළ බව සඳහන් කරමින් 1983.03.31 වැනි දින දරණ ලිපියෙහි දැක්වූ පරිදි කාමර 456 ක (එනම් අමුත්තන්ගේ කාමර 452 ක් සහ කළමණාකාරවරුන්ගේ කාමර 4 ක් වූ පදනම මත ආදායම් හා වියදම් පිළිබඳ පූර්වානුමාන ප්‍රකාශයන් ගණන් බැලීමට පදනම් කරගත් අනුමත මුල් ගෘහ නිර්මාණ සැළසුම් හිල්ටන් ඉන්ටර්නැෂනල් ආයතනයෙන් ලබාගැනිමට පැමිණිලිකරු ද දැනට උත්සහා දරමින් සිටි.

51. (අ) හෝටලයට අදාළ වන කරුණු පිළිඳව වැඩිදුරටත් සොයා බැලීමේ දී ඉහත කී සැපයිම් කොන්ත්‍රාත්තුව යටතේ 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම විසින් සපයන ලද ගෘහ භාණ්ඩ සවිකිරිම්, උපකරණ පිළිබඳව නිසි පරිදි ගිණුම් ගතකර සසඳා බැලූ දේපල ලැයිස්තුවක් නොමැති බව ද පැමිණිලිකරුට දැන් දැනගන්නට ලැබී ඇත.

(ආ) මෙහි 1 වැනි වගන්තියේ නියම කර දක්වා ඇති පරිදි 'ඒ' ප්‍රදර්ශකයේ 1 වැනි විත්තිකාර මිට්සුයි සමාගම විසින් සැපයිය යුතු ගෘහ භාණ්ඩ සවිකිරිම් සහ උපකරණ සැපයීම්වල විෂය ප්‍රමාණය නිශ්චිත වශයෙන් දක්වා ඇති අතර, එකී සැපයීම් කොන්ත්‍රාත්තුවේ අවශ්‍ය කොටසක් වශයෙන් සෑදී තිබේ.

(ඇ) 4 වැනි විත්තිකාර එකී හොටල් ඩෙවලොපර්ස් සමාගමේ සාමාන්‍යාධිකාරි වෙත යැවූ 1990 අගෝස්තු මස 24 දිනැති පැමිණිලිකරුගේ ලිපියට පිළිතුරු වශයෙන්, එකී සැපයුම් ගිවිසුමේ <u>'ඒ' ප්‍රදර්ශනය දැනට නැති බව</u> සහ දැනට තිබෙන්නේ 1986 ජුනි මාසයේ දී පමණක් 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පි සමාගම විසින් ඉදිරිපත් කරන ලද <u>ප්‍රදර්ශන ඒ </u>වශයෙන් විස්තර කළ ගෘහ භාණ්ඩ, උපකරණ ලැයිස්තුවක් පමණක් බවත් හෙලිදරව් කරමින් එකී සාමාන්‍යාධිකාරිගෙන් 1990 සැප්තැම්බර් 5 දිනැති පිළිතුරු ලිපියක් පැමිණිලිකරුට ලැබුණේ ය. 1990.08.24 සහ 1990.09.05 දිනැති එකී ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී49ඒ සහ පී49බී** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඈ) ලියවිල්ලක් වශයෙන් අරමුණු කළ මෙම ලියවිල්ල 1984.01.31 දින එකී සැපයුම් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේ අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් නොවන බවත්, 1985 දී ඉදිරිපත් කරන සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම්වලට සරිලන පරිදි 3 වැනි විත්තිකාර නිර්මාණ ශිල්පීන් විසින් පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බව පෙනී යන බවත් පැමිණිලිකරු විසින් දැනගෙන ඇත.

(ඉ) සිය නියෝජිතයා 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ විධායක අධ්‍යක්ෂව සිටි 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය විසින් සපයන ලද එකී දේපල පිළිබඳ නිසි ලෙස ගණන් බැලූ සහ සැසඳුම් කළ දේපල ලැයිස්තුවක් එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට නැත.

52. (අ) විශේෂයෙන්ම අවසර නොලත් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් කට්ටලක් සොයාගැනීමෙන් පසුව සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය සඳහා සාකච්ඡා කිරීම සහ සාකච්ඡා කර නියම කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන්ට පැමිණිලිකරු සහාය වෙමින් සිටි නිසාත්, පැමිණිලිකරුගේ 1990.04.27 දින හා 1990.05.14 දින දරණ පැමිණිලිකරුගේ ලිපි පරිදි, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්.පාස්කරලිංගම් මහතාගේ අවධානයට මෙම කරුණ පැමිණිලිකරු විසින් යොමු කරන ලදී.

(ආ) තවද, ඉහත සඳහන් කරුණු අනුව, පැමිණිලිකරු විසින් මුදල් අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ බී.වයි.එම්.කාසිව්ට්ටි මහත්මිය වෙත ලිපි කීපයක්ම ඉදිරිපත් කරන ලද අතර, එකී ආර්.පාස්කරලිංගම් මහතා අමතන ලද 1990.06.29 දින දරණ පැමිණිලිකරුගේ ලිපියෙන් පැමිණිලිකරු විසින් අනෙකුත් කරුණු අතර, මෙසේ ප්‍රකාශ කර සිටි. ''පළමු වතාවේ දී ම අදාළ පැහැදිලි කිරීම් සහ සම්බන්ධිත සහතික කිරීම් සතුටුදායක ලෙස විසඳා ගන්නාතුරු විදේශිය අනුග්‍රාහකයන් සමඟ සාකච්ඡා කර නියම කර ගැනීම් කිසිවක් අවසන් කළයුතු යයි මම නොසිතමි.

1990.06.29 වැනි දින දරණ එකී ලිපියේ සත්‍ය පිටපතක් **පී50** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

53. (අ) 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය ප්‍රවර්ධනකරුවන් මෙන්ම ක්‍රියාකාරී පාර්ශවයක් වූ තවද ණයට මුදල් සපයන්නන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් ආයෝජකයන් වශයෙන් චරිතාංග ගණනාවක් හෙබවූ විධායක කළමණාකාරත්වය පිළිබඳව ක්‍රියාවක් කරමින් අධ්‍යක්ෂකවරුන් වශයෙන් සිටි 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ මූල්‍ය තත්ත්වය එසේ

තිබියදී සහ තවද එකී ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව <u>සහතික නොකර</u> පවත්නා බවට පැමිණිලිකරු විසින් පෙන්නා දෙන ලද නමුත්, 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය හුදෙක් නොකඩවා සහ නැවත නැවතත් මූලිකව මුදල් අයකර ගැනීම සඳහා පමණක් සැලකිලිමත්වී ඇත.

(ආ) ඉදිරිපත් කරන ලද විරෝධතාවයන් නොතකා හිතාමතා හා ඕනෑකමින්ම කල්දැම්ම හා ආරම්භක ගෙවීම් 1990 මාර්තු 11 වැනි දිනට එක්රැස් කිරීම මඟින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය විසින් උත්සාහ දරා ඇත්තේ විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම සහ එකී ණයවලට වූ ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා රජයට බලපෑම් කිරීමට පමණකි.

(ඇ) තවද, පැමිණිලිකරුගේ නොකැමැත්ත සහ ඔහු විසින් කරන ලද සහ විරුද්ධතාවයන් නොසළකා 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය බලපෑම් කර 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ සාමාජිකයින් ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකක් වන (රුපියල් මිලියන 80) ගෙවීමක් ලබාගත් අතර, ඉදිකිරීම සම්බන්ධව පැන නැග තිබූ ප්‍රශ්න නොසලකා එම මුදල ඉතිරි ඉදිකිරීම හිඟ මුදල් වෙනුවෙන් යොදාගෙන ඇත. 1990.08.27 දිනැති පැමිණිලිකරුගේ ලිපියේ සත්‍ය පිටපතක් **පී51** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

(ඈ) දැනට මතු වී ඇති නමුත් නොසලකා හරින බව පෙනි යන බරපතල වෙනස්කම් නොතකා තවදුරටත් ගෙවීම් ලබාගැනිමට අයථා බලය සහ/හෝ බලපෑම් ඇති කිරීම සඳහා ප්‍රයත්නයක් දරනු ඇතැයි පැමිණිලිකරු සිය පහළ කරුණු අතර, කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට අසමත්වීම නිසා කිසිදු ගෙවීමක් ලබාගැනිමට 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සන්දානය මෙම වෙනස්කම් මඟින් වලකාලයි. කෙසේ හෝ වේවා 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම සහ එකී ණය මුදලේ එකී ඇපකරුවන් මෙම කාරණය තීරණය කරන තෙක් කිසිදු ගෙවීමක් කිරීමට හිමිකම් නොලබයි. ඉහත කී ඇපකර ලියුම් යටතේ මුදල් ඉල්ලා සිටිමේ තර්ජනය මත ඉදිකිරීමේ සහ රඳවා ගැනිමේ ඉතිරි මුදල් සඳහා ඉල්ලුම් කරන වැඩිදුර මුදල් ප්‍රමාණය සමඟ 1990.09.18 දිනෙන් අවසන් වන පැහැර හැරීමේ කාල සීමාවක් ද සහිතව 1990.09.11 දිනට තවත් ගෙවීම් දිනයක් යෙදෙන බව පැමිණිලිකරු වෙත පවසා සිටියි.

පී34ඒ ලකුණු කර නැවත ලේඛණගත කිරීමේ ගිවිසුම් සහ **පී15** ලකුණු කර ඇති එකී ණය ගිවිසුම සඳහා වන ඇමුණුම් බලන්න.

54 (අ) 1990 අප්‍රේල් මස 24 වැනි දින දරණ සිය සංදේශයෙන් පැමිණිලිකරු විසින් මෙම විෂය කරුණෙහි දක්වන ලද බරපතලකම නොතකා මෙම කරුණෙහි බරපතලකම සලකා පැමිණිලිකරුට මෙම කරුණ සම්බන්ධව තවදුරටත් කටයුතු කරන ලෙසට ඉල්ලා සිටි කේ.ෂන්මුගලිංගම් මහතා ගෙන් හැර, එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් මේ පිළිබඳ සිතා බැලීමක් හෝ තීරණයක් ලැබී නොමැත.

(ආ) අනතුරුව මෙම විෂය කරුණෙහි බරපතල ස්වරූපය හේතුකොටගෙන දේශිය අධ්‍යක්ෂවරුන් අතරේ බෙදා හරින ලද 1990 මැයි 31 වෙනි දින දරණ ලිපියෙන් ප්‍රතිවිරුද්ධ අයිතිවාසිකම් හේතුකොට ගෙන එවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකින් ඉල්ලා අස්වන ලෙසට 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ පත්කරන ලද අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලමින් මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සාකච්ඡා කිරීමට ගන්නා ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින ලදී. කරුණු මෙසේ හෙයින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයට එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම මඟින් ඉදිරිපත් කරන ලද 1990.04.27 දින දරණ ලිපියේ අදහස්වලට තමාට එකඟ විය නොහැකි බවට පැමිණිලිකරු තවදුරටත් පෙන්වා දෙන ලදී.

(ඇ) (i) තවද ඉහත සඳහන් කරුණු නොසලකා එකී 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානය අමතා යවන ලද 1990 ජුලි මස 28 වැනි දින දරණ ලිපිය 1 වැනි සහ 2 වැනි විත්තරුවන් යැවූ විට කර ඇති යථෝක්ත ලිපියේ අඩංගු කරුණු වලට පැමිණිලිකරුට 1990 අප්‍රේල් 24 වැනි දින දරණ පැමිණිලිකරුගේ සංදේශයේ අඩංගු කරුණු සළකා බලන විට පැමිණිලිකරුට එකඟ විය නොහැකි බව දක්වමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදාහරින ලද 1990 ජුනි මස 29 වෙන දින දරණ සංදේශයක් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර බෙදාහරින ලදී.

(ii) ආයෝජන ගිවිසුමේ විධිවිධානයන්ට පටහැනි වන අන්දමින් සංශෝධිත ගෘහ නිර්මාණ සැළසුම් අවසර නොලත් කට්ටලයකට අදාළ වන හෙයින් කොන්ත්‍රාත්තු සහතික කිරීම්වල ඌනතාවය පෙන්නුම් කරමින් ගිවිසුම්වල සහ ඇපකරවල වලංගුභාවය පවා ප්‍රශ්නයට භාජනය වන බව තමාගේ මතය බවත් මෙම කරුණ පිළිඳව දැඩි සැළකිල්ලක් ගෙන තවදුරටත් පමා නොවීමේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් සමාගම ගතයුතු බවත් පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව අධ්‍යක්ෂකවරුන් වෙත බෙදා හරින ලද 1990 ජූලි මස 04 වැනි දින දරණ සංදේශය මගින් මෙම කරුණ පිළිබඳව පැමිණිලිකරු තවදුරටත් කටයුතු කරන ලදී.

(ඈ) පැමිණිලිකරු විසින් නොකඩවා කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන් 1990.08.09 වැනි දින දේශිය අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක් පවත්වන ලදී. මෑතක දී හෙළිදරව් වූ පරිදි ඉහත දක්වා ඇති සියලුම කරුණු පැමිණිලිකරු විසින් නැවත නැවතත් සඳහන් කර මෙය සම්බන්ධයෙන් තදබල ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට තරයේ ඉල්ලා සිටියේ ය. 4 වැනි විත්තිකාර එකී හෙටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට හිල්ටන් ආයතනයේ ගෘහ නිර්මාණ ශිල්පීන් සමග මෙම කරුණ පිළිබඳව තවදුරටත් කටයුතු කරන බව පැමිණිලිකරු දෙනුම් දුන් අතර, එකී දේශිය අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේ වාර්තා සටහන් ද ඉදිරිපත් කිරිමට භාර ගනිමින් ප්‍රථම වශයෙන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයට 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම විසින් යැවීම සඳහා ලිපියක් ඔහු විසින් කෙටුම්පත් කරන බවත් දැන්වීය. පැමිණිලිකරුගේ 1990.08.29 වැනි දින දරණ සංදේශය අනුව (එකී දේශිය අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරින ලද පැමිණිලිකරුගේ 1990.08.29 දින දරණ සංදේශය පරිදි පැමිණිලිකරු විසින් මෙය ඉටු කරන ලදී.

පැමිණිලිකරුගේ 1990.05.31 වෙන දිනැති ලිපිය සහ 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සංවිධානයේ 1990.04.27 දරණ ලිපිය සහ 1990.06.22 දරණ ලිපිය, 1990.06.29 දිනර දරණ, 1990.07.04 වැනි දින, 1990.08.29 වෙනි දින දරණ සංදේශය සහ 1990.08.09 වෙනි දින පවත්වන ලද එකී රැස්වීමේ කෙටුම්පත් වාර්තා සටහන් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ එකී සංවිධානයට යැවීම සඳහා වූ කෙටුම්පත් ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **පී52ඒ, පී52බී, පී52(සී), පී52ඩී, පී52ඊ, පී52එෆ්, පී52ජී සහ පී52එච්** ලකුණු කර මෙම පැමිණිලි පතට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටස් වශයෙන් සැළකර සිටියි.

55. (අ) මින් ඉහත 28 වෙනි ජේදයෙහි සඳහන්කර ඇති ගින්නෙන් පසුව 3 වැනි විත්තිකාර ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයේ වාර්තාවන් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සමහර මාස සඳහා වෙනුවෙන් පමණක් මාසික ප්‍රගති වාර්තා පිටපත් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගෙන් මිට්සූයි/තායිසෙ සංවිධානයේ නියෝජිත විධායක අධ්‍යක්ෂ එම්.ඔගම් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

(ආ) පැමිණිලිකරු විසින් මෑතකදී හොටල් ඉදිකිරීම පිළිබඳ කරුණු සොයා බැලීමේ දී සහ මෙම වාර්තා වඩාත් සුපරික්ෂාකාරිව පරික්ෂා කිරීමේ දී එකී හෝටල් ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව මාසික වාර්තාවල දැක්වෙන පරිදි හෝටල් ගොඩනැගිල්ලේ මහල් 20 ක් ලෙස බව පැමිණිලිකරුට එළිදරව් වූ අතර, එයට මෙය ඉදිකිරීමේ ගිවිසුමේ එකී ගොඩනැගිල්ල මහල් 22 ක් අඩංගු විය යුතු බව පැහැදිලිව නියම කර තිබූ අතර, <u>ඉදිකිරීම් ගිවිසුමට පටහැනි, එය උල්ලංඝනය කරන සහ  අඩු කරන බවට තමන් විසින්ම පිළිගැනීමත් ය.</u>

(ඇ) තවද, ගොඩනැගිල්ලේ ඉහළම මහළ 19 වැනි මහළ බවත්, එකී ගොඩනැගිල්ලේ උස මීටර් 71.2 ක් වන බවත් එකී මාසික වාර්තාමෙන් පෙන්නුම් කෙරේ.

අංක.25 දරණ (1986 නොවැම්බර්) එකී මාසික වාර්තාවේ ද සහ අංක.39 දරණ මාසික වාර්තාව (1987 අප්‍රේල්) සත්‍ය පිටපත් **පී53ඒ සහ පී53බී** සළකුණු කොට මෙම පැමිණිල්ලට අමුණා මෙහි කොටසක් වශයෙන් සැළකර සිටී.

56. මිට්සුයි/තායිසෙ සංවිධානය සහ 4 වැනි විත්තිකාර සමාගම අතර අත්සන් කරන ලද ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවලට 17(6) වගන්තිය අනුව අවසන් සහතිකයට පසු වගකීම මාතෘකාව යටතේ පහත සඳහන් පරිදි ඉඩකඩ සලකා තිබෙන බව පැමිණිකරු ප්‍රකාශ කරයි :-

> ''මෙහි මතු පහත වෙනත් ආකාරයකින් ඉඩකඩ සලසා නොමැත්තේ නම් වැඩ සඳහා හෝ කිසියම් අංශයන් හෝ අවසන් සහතිකය නිකුත් කිරීමෙන් පසුව වැඩවලට හෝ එයින් කොටසකට සිදුවන දෝෂ සම්බන්ධයෙන් හෝ හානි සම්බන්ධයෙන් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් සේව්‍යයාට හෝ වෙනත් පාර්ශවයකට හෝ සිදුවන්නා වූ හානි හෝ පාඩු සම්බන්ධයෙන් සංවිධානය කිසිම වගකීමට බැඳී නොසිටී. කෙසේ වෙතත් අවසන් සහතිකය නිකුත් කිරීමෙන් අවුරුදු පහක් ඇතුළත එම වැඩවල හෝ එහි කොටසක හෝ ඇතුළත් වී තිබූ දෝෂ හේතුකොටගෙන, දෝෂ හෝ පාඩු සිදුවූයේ නම් එම දෝෂ හෝ පාඩු මෙහි පහත දැක්වෙන වැඩ ඉටුකිරීමේ දී සංවිධානයේ ද්වේශ සහගත චේතනාත්මකව හෝ තදබල නොසැළකිල්ලක් නිසා හෝ සිදුවූ බවට පැවරිය හැකි නම් එවැනි දෝෂ හෝ හානි සහ පාඩු සම්බන්ධයෙන් සේව්‍යයා වෙත සංවිධානය වගකීමෙන් බැඳී සිටියි.''

57. මෙහි මීට පෙර සඳහන් කළ එකී ඉදිකිරීම් ගිවිසුමේ සහ ඉදිකිරීම සඳහා වන ගිවිසුම පිළිබඳ පොදු කොන්දේසි යන ලියවිලිවල අවශ්‍ය කොටසක් වශයෙන් සමන්විත නොවන, අවසර නොලත් සැළසුම් කට්ටලයක් සම්බන්ධව එකී වැඩ අවසන් සහතිකය සහ අවසාන සහතික ගැන සඳහන් කරන බවත්, මෙහි අඩංගුව තිබෙන් සම්ප්‍රකාශයන්වල පසුබිම

යටතේ වැඩ අවසන් සහතිකය සහ අවසාන සහතිකය නිකුතුව වංචා සහගත, නීතියෙන් ශුන්‍ය සහ බලරහිත හා බලයක් හෝ ප්‍රයෝජනයක් නැති එකක් බවත් පැමිණිලිකරු ප්‍රකාශ කරයි. එකී සහතික පිළිබඳ එකී නිකුතුව ව්‍යාජ සහගත සහ 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට වංචා කිරීමේ අදහස ඇතිව සහ 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට සහ 3 වැනි විත්තිකාර එකී ගෘහ නිර්මාණ ශිල්පීන්ට වංචා සහගත ලෙස වාසිදායක වනසේ වීමට කළ නිකුතුවක් බව පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කරයි.

58. (අ) පැමිණිලිකරු විධායක බලතල නැතිව ඔහු 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු පමණක් වුවත්, ඔහු 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගම, එහි කොටස් හිමිකරුවන් හා කොටස් හිමියෙකුගේ තත්ත්වයෙන් ඔහුම වෙනුවෙන් සහ පොදු යහපත තකා 1 වැනි සහ 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම් 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට සහ එහි කොටස් හිමිකරුවන්ට විරුද්ධව කරන ලද මෙම වංචාව විභාග කිරීමේ දී සහ හෙළිදරව් කිරීමේ දී සෑහෙන සහ වටිනා පෞද්ගලික කාලය සහ උත්සාහය වැය කර ඇති බව කියා සිටියි.

(ආ) මෙහි පහත අයැද ඇති සහනයන් ලබා දුනහොත් මිස 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට සහ පැමිණිලිකරු ඇතුළුව එහි කොටස් හිමියන්ට හා පොදු මහජනයාට අප්‍රතිකාර අනර්ථයක් සහ පිරිමැසිය නොහැකි පාඩු, අලාභ සහ විපත් ඇති කරවන්නේ යැයි පැමිණිලිකරු ප්‍රකාශ කරයි.

59. ඉහත කී පූර්වාවයවයෙන් පහත සඳහන් සහනයන් ඉල්ලා සිටීමට පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපචිත වී ඇත.

(අ) මෙහි සඳහන් කර ඇති එකී ඉදිකිරීම් ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය අනුව මොන මොන කවර හෝ ගෙවීමකින් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට හිමිකමක් නැති බවට ප්‍රකාශයක්,

(ආ) මෙහි සඳහන් කර ඇති එකී සැපයුම් ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය මොන කවර හෝ ගෙවීමකටවත් 2 වැනි විත්තිකාර මිට්සුයි සමාගමට හිමිකම් නැති බවට ප්‍රකාශයක්,

(ඇ) මෙහි සඳහන් කර ඇති එකී සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය අනුව මොන මොන කවර හෝ ගෙවීමක්වත් ලබාගැනීමට 3 වැනි විත්තිකාර සමාගමට හිමිකම නැති බවට ප්‍රකාශයක්,

(ඇ) මෙහි සඳහන් කර ඇති එකී ණය ගිවිසුම යටතේ මොන මොන කවර හෝ මුදල් ගෙවීමක් ඉල්ලා සිටීමට සහ/හෝ කවර ගෙවීමක්වත් ලබාගැනීමට ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සූයි/තායිසෙ සංවිධානයට හිමිකමක් නැති බවට සහ එමනිසා, මෙහි සඳහන් කර ඇති එකී ඇපකර යටතේ මුදල් ඉල්ලා සිටීමෙන් සහ/හෝ ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන් නිවාරණය වී ඇති බවට ප්‍රකාශයක්,

(ඉ) මෙහි සඳහන් කර ඇති එකී ගිවිසුම් යටතේ, එනම්, ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම සහ ණය ගිවිසුම යටතේ ඉහත නම සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට මොන මොන තවත් කරව ගෙවීමක් කිරීමටවත් 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම කවර බැඳීමකටවත් යටත් නැති බවට ප්‍රකාශයක්,

(ඊ) ඉහත නම සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අද දක්වා ගෙවූ සහ එම සමාගම විසින් ලබාගන්නා ලද මුදල් සියල්ලම ආපසු ගෙවනු ලැබීමට සහ/හෝ නැවත ලබාගැනීමට 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට හිමිකම තිබෙන බවට ප්‍රකාශයක්,

(උ) මෙම නඩුවේ අවසාන නිගමනය කරනතුරු පැමිණිලි පතේ සඳහන් කර ඇති එකී ගිවිසුම්, එනම් ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඇපකර දෙක යටතේ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටීමෙන්, අරගැනීමෙන්, ලබාගැනීමෙන් සහ/හෝ එකතුකර ගැනීමෙන් එකී මිට්සූයි/තායිසෙ සංවිධානය සහ එකී නිර්මාණ ශිල්පීන් යන පිළිවෙලින් 1, 2, 3 විත්තිකාර සමාගම් ඔවුන් විසින්ම, ඔවුන්ගේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයි කවර හැටියකින් වුවත් වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක්,

(ඌ) මෙම නඩුවේ අවසාන නිගමනය කරන තුරු පැමිණිලි පතේ සඳහන් එකී ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ ඇපකර දෙක යටතේ ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අභූත ලෙස ලැබිය යුතු එකී හිමිකම් ප්‍රකාශ සහ ගෙවීම්වලට සම්බන්ධ 1 වැනි සහ/හෝ 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් මුදල් සම්බන්ධ යම් නියම කර ඉල්ලා සිටීම් සහ/හෝ මොන මොන හිමිකම් ප්‍රකාශ භාරගැනීමෙන් සහ/හෝ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන යම් මුදලක් ගෙවීමක්වත් කිරීමෙන් 4 වැනි විත්තිකාර සමාගම එම සමාගම විසින්ම, එහි අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සහ නියෝජිතයින් හෝ වෙනත් අය මඟින් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් අතුරු තහනම් නියෝගයක්,

(එ) පැමිණිලි පතේ සඳහන් කර ඇති එකී ගිවිසුම් එනම්, ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඇපකර දෙක යටතේ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටිමෙන්, අරගැනිමෙන්, ලබාගැනිමෙන් සහ/හෝ එකතුකර ගැනීමෙන් එකී මිට්සූයි/තායිසෙ සංවිධානය සහ එකී නිර්මාණ ශිල්පීන් යන පිළිවෙලින් 1, 2, 3 විත්තිකාර සමාගම් ඔවුන් විසින්ම, ඔවුන්ගේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් ස්ථිර තහනම් නියෝගයක්,

(ඒ) පැමිණිලි පතේ සඳහන් එකී ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැළසුම් සහ අධික්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ ඇපකර දෙක යටතේ ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අභූත ලෙස ලැබිය යුතු එකී හිමිකම් ප්‍රකාශ සහ ගෙවීම්වලට සම්බන්ධව 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් මුදල් සම්බන්ධ යම් නියම කර ඉල්ලා සිටිම සහ/හෝ මොන මොන හිමිකම් ප්‍රකාශ භාර ගැනීමෙන් සහ/හෝ කොයි කවර ආකාරයකින් වුවත් මොන මොන යම් මුදලක් ගෙවීමක්වත් කිරීමෙන් 4 වැනි විත්තිකාර සමාගම එම සමාගම විසින්ම, එහි අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සහ නියෝජිතයින් හෝ වෙනත් අය මඟින් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් ස්ථිර තහනම් නියෝගයක්.

60. පැමිණිලිකරු මෙම නඩුව මුද්දර කාර්යය සඳහා රු.100,000/- මුදලකට අගය කරයි.

61. මෙහි අඩංගුව තිබෙන සම්ප්‍රකාශයන් කිපයක් කිරීම්වස්, පැමිණිලිකරුගේ දිවුරුම්පතක් මෙයට අමුණා ඇත.

**එබැවින් ,**

(අ) මෙහි සඳහන් කර ඇති එකී ඉදිකිරීම් ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය අනුව මොන මොන කවර හෝ ගෙවීමකටවත් 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම්වලට හිමිකමක් නැති බවට ප්‍රකාශයක්,

(ආ) මෙහි සඳහන් කර ඇති එකී සැපයුම් ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය අනුව මොන මොන කවර හෝ ගෙවීමකටවත් 2 වැනි විත්තිකාර මිට්සූයි සමාගමට හිමිකම් නැති බවට ප්‍රකාශයක්,

(ඇ) මෙහි සඳහන් කර ඇති එකී සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම යටතේ සහ ප්‍රකාර සහ එහි භාවය අනුව මොන මොන කවර හෝ ගෙවීමක්වත් ලබාගැනීමට 3 වැනි විත්තිකාර සමාගමට හිමිකම නැති බවට ප්‍රකාශයක්,

(ඈ) මෙහි සඳහන් කර ඇති එකී ණය ගිවිසුම යටතේ මොන මොන කවර හෝ මුදල් ගෙවීමක් ඉල්ලා සිටිමට සහ/හෝ කවර ගෙවීමක්වත් ලබාගැනීමට ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකාර මිට්සුයි/තායිසෙ සංවිධානයට හිමිකමක් නැති බවට සහ එමනිසා, මෙහි සඳහන් කර ඇති එකී ඇපකර යටතේ මුදල් ඉල්ලා සිටීමෙන් සහ/හෝ ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන් නිවාරණය වී ඇති බවට ප්‍රකාශයක්,

(ඉ) එකී ගිවිසුම් යටතේ, එනම්, ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම සහ ණය ගිවිසුම යටතේ ඉහත නම සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට මොන මොන තවත් ගෙවීමක් කිරිමටවත් 4 වැනි විත්තිකාර එකී හොටෙල් ඩෙවලොපර්ස් සමාගම කවර බැඳීමකටවත් යටත් නැති බවට ප්‍රකාශයක්,

(ඊ) ඉහත නම සඳහන් 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අද දක්වා ගෙවූ සහ එම සමාගම් විසින් ලබාගන්නා ලද මුදල් සියල්ලම ආපසු ගෙවනු ලැබීමට සහ/හෝ නැවත ලබාගැනිමට 4 වැනි විත්තිකාර හොටෙල් ඩෙවලොපර්ස් සමාගමට හිමිකම තිබෙන බවට ප්‍රකාශයක්,

(උ) මෙම නඩුවේ අවසාන නිගමනය කරනතුරු පැමිණිලි පතේ සඳහන් කර ඇති එකී ගිවිසුම්, එනම් ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධික්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඇපකර දෙක යටතේ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටිමෙන්, අරගැනිමෙන්, ලබාගැනිමෙන් සහ/හෝ එකතුකර ගැනීමෙන් එකී මිට්සුයි/තායිසෙ සංවිධානය සහ එකී නිර්මාණ ශිල්පින් යන පිළිවෙලින් 1, 2, 3 විත්තිකාර සමාගම් ඔවුන් විසින්ම, ඔවුන්ගේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයි කවර හැටියකින් වුවත් වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක්,

(ඌ) මෙම නඩුවේ අවසාන නිගමනය කරනතුරු පැමිණිලි පතේ සඳහන් එකී ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධික්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ ඇපකර දෙක යටතේ ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අභූත ලෙස ලැබිය යුතු එකී හිමිකම් ප්‍රකාශ සහ ගෙවීම්වලට සම්බන්ධ 1 වැනි සහ/හෝ 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් සම්බන්ධ යම් නියම කර ඉල්ලා සිටීම් සහ/හෝ මොන මොන

හිමිකම් ප්‍රකාශ භාරගැනීමෙන් සහ/හෝ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන යම් මුදලක් ගෙවීමක්වත් කිරීමෙන් 4 වැනි විත්තිකාර සමාගම එම සමාගම විසින්ම, එහි අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සහ නියෝජිතයින් හෝ වෙනත් අය මඟින් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් අතුරු තහනම් නියෝගයක්,

(එ) පැමිණිලි පතේ සඳහන් කර ඇති එකී ගිවිසුම් එනම්, ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැළසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඇපකර දෙක යටතේ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටීමෙන්, ඉල්ලා සිටීමෙන්, අරගැනීමෙන්, ලබාදීමෙන් සහ/හෝ එකතුකර ගැනීමෙන් එකී මිට්සුයි/තායිසෙ සංවිධානය සහ එකී නිර්මාණ ශිල්පීන් යන පිළිවෙලින් 1, 2, 3 විත්තිකාර සමාගම් ඔවුන් විසින්ම, ඔවුන්ගේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් ස්ථිර තහනම් නියෝගයක්,

(ඒ) පැමිණිලි පතේ සඳහන් එකී ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැළසුම් සහ අධික්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ ඇපකර දෙක යටතේ ඉහත කී 1 වැනි සහ/හෝ 2 වැනි සහ/හෝ 3 වැනි විත්තිකාර සමාගම්වලට අභූත ලෙස ලැබිය යුතු එකී හිමිකම් ප්‍රකාශ සහ ගෙවීම්වලට සම්බන්ධව 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වලින් මුදල් සම්බන්ධ යම් නියම කර ඉල්ලා සිටීම සහ/හෝ මොන මොන හිමිකම් ප්‍රකාශ භාර ගැනීමෙන් සහ/හෝ කොයි කවර ආකාරයකින් වුවත් මොන මොන යම් මුදලක් ගෙවීමක්වත් කිරීමෙන් 4 වැනි විත්තිකාර සමාගම එම සමාගම විසින්ම, එහි අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් සහ නියෝජිතයින් හෝ වෙනත් අය මඟින් කොයි කවර හැටියකින් වුවත් තහනම් කරමින් ස්ථිර තහනම් නියෝගයක්,

(ඔ) නඩු ගාස්තු සහ

(ඕ) මෙම අධිකරණයට මැනවැයි පෙනෙන එවැනි තවත් හෝ වෙනත් සහන පැමිණිලිරකෑ අයැද සිටි.

***Sgd/- De Silva & Perera.***

පැමිණිලිකරුගේ නීතිඥවරුන්.

**<u>පැමිණිලිපතට අමුණා ඇති ලියකියවිලි.</u>**

(01) පැමිණිලිකරුගේ පෙරකලාසිය.

(02) 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියවිලි.

(03) පැමිණිලිකරුගේ දිවුරුම්පත.

***Sgd/- De Silva & Perera.***
පැමිණිලිකරුගේ නීතිඥවරුන්.

නීතිඥ ඒ.ඒ.ඇම්.ඉලියාස්
නීතිඥ ඇස්.ශ්‍රී. ස්කන්ධන්
ජනාධිපති නීතිඥ කේ.කනග්-ඊස්වරන්
රාජ නීතීඥ පී.නවරත්නරාජ
විසින් සකස් කරන ලදී.